# පරණ ගිවිසුම

## පංති සාමාජිකයාගේ අධ්‍යයන උපදෙස් පොත



## ඉදිරිපත්කිරීම

මෙම පාඨමාලාව මූලිකවම යොමුව තිබෙන්නේ පරණ ගිවිසුමේ ඉගැන්වීම් මතය. එමගින් අනගි මුතු ඇටයේ කොටසක් වන, මෝසෙස් සහ ආබ්‍රහම්ගේ පොත්ද ආවරණ-යවේ. දෙවියන්වහන්සේ ස්වර්ගයේ පැවැත්වූ සම්මන්ත්‍රනයේ සිට ගැලවුම්කරුවාණන්ගේ උපතට පෙර වසර කිහිපයක කාලයක් උන්ව-හන්සේ සිය ජනතාව සමග කළ කටයුතුවල විස්තරයක් මෙම පොත්වලින් අපට ලබාදෙයි. ඇදහිල්ලේ සහ කීකරුකමේ බලවත් උදාහරණ එමගින් පිරිනමයි. අමතකකිරීම, අකීකරුවීම, හෝ විරුද්ධවීමේ ප්‍රතිඵලද එමගින් පෙන්වයි. මෙම පොත්වල එන අනාවැකි මගින් ගැලවුම්-කරුවාණන්ගේ උපත, වන්දිගෙවීම, දෙවන පැමිණීම, සහ සහස්‍රයේ රාජ්‍ය පාලනය ගැනද සාක්ෂි දරයි.

සෑම සතියක් සඳහා කියවීමේ පැවරුම් මෙම අධ්‍යයන උපදෙස් පොතේ පෙන්වාදී ඇති අතර, බුද්ධිගෝචර ප්‍රශ්නද ලබාදී ඇත. ඔබගේ අවබෝධය සහ දැනුම වර්ධනයකිරීම සඳහා අමතර ශුද්ධ ලියවිලිද යෝජනාකර ඇත. අධ්‍යයන උපදෙස් පොත සැලසුම්කර තිබෙන්නේ පහත සඳහන් පාවිච්චිය සඳහාය.

අ. *පුද්ගලික ශුද්ධ ලියවිලි අධ්‍යයනය.* එක් එක් කියවීමේ පැවරුම්වල ඇතුලත්කර තිබෙන අදාළ ප්‍රශ්න මගින් ක්‍රිස්තුස්වහන්සේ වෙතට සමීපවන අන්දම ගැන දැනගැනීමට පරණ ගිවිසුමේ අනාගතවක්තෘවරුන්ගේ ඉගැන්වීම් ඔබට උපකාරකරයි.

ආ. *පවුලේ ශුද්ධලියවිලි අධ්‍යයනය.* මෙම අධ්‍යයන උපදෙස් පොත පවුල් නිවාස සැන්දෑවේ පාඩම් සහ පවුලේ වෙනත් සාකච්ඡා සඳහා මාහැගි උපකරණයකි.

ඇ. *පංති සාකච්ඡා සඳහා සූදානම්වීම.* ඔබ කියවීමේ පැවරුම් අධ්‍යයනයකරමින්, අදාළකිරීමේ ප්‍රශ්න ගැන සිතාබලන විට, ඔබගේ සුභාරංචි ඉගැන්වීමේ පංතියට අර්ථවත් යමක් ඉදිරිපත්කිරීමට ඔබ හොඳින් සූදානම්ව සිටිනු ඇත.

ඔබ ආත්මයාණන්වහන්සේගේ මගපෙන්වීම අනුව අධ්‍යනයකිරීමෙන්, යෝබ් මෙන් මෙසේ සාක්ෂි දැරීමට ඔබට හැකිවනු ඇත. "එහෙත් මගේ මිදුම්කාරයාණන් ජීවත්ව සිටින බවද, අන්තිමේදී උන්වහන්සේ පොළොව පිට සිටින බවද දනිමි" (යෝබ් 19:25 ).

## "මේ මාගේ කාර්යය සහ මාගේ මහිමයයි" 1

***මෝසෙස් 1***

පහත සඳහන් ශුද්ධ ලියවිලි අධ්‍යයනය කරන්න.

අ. මෝසෙස් 1:1–11. මෝසෙස් දෙවියන්ව-හන්සේ දැක උන්වහන්සේ සමග මුහුණට මුහුණ කථාකරයි. ඔහු පියාණන්ගේ ඒක-ජනක පුත්‍රයාණන්ගේ සමානත්වයෙන් යුත් දෙවියන්වහන්සේගේ පුත්‍රයෙකු බව මෝසෙස් දැනගනියි.

ආ. මෝසෙස් 1:12–23. සාතන් මෝසෙස් ඉදිරියට එයි. මෝසෙස් ඔහුව එලවාහරියි.

ඇ. මෝසෙස් 1:24–39. දෙවියන්වහන්සේ නැව-තත් ප්‍රකාශවී, තමන්වහන්සේගේ වැඩකට-යුතු සහ මහිමය ගැන උගන්වති.

- මෝසෙස් 1:1–7 විස්තරවන අත්දැකීම් මගින් දෙවියන්වහන්සේ ගැන මෝසෙස් දැනගත් දේවල් මොනවාද? මෝසෙස් තමා ගැනම දැනගත් දේවල් මොනවාද? අප දෙවියන්ව-හන්සේගේ පුත්‍රයාණන්ගේ සමානත්වයෙන් සාදන ලද උන්වහන්සේගේ දරුවන් බව දැනගැනීමෙන් අපගේ ජීවිතවල ඇතිවන වෙනස කුමක්ද?
- මෝසෙස් සාතන්ගේ පරීක්ෂාවන්ට විරුද්ධ-වීමට ශක්තිය ලබාගත්තේ කෙසේද? (බලන්න මෝසෙස් 1:18, 20–21.) මෝසෙස් සාතන්ව පිටත් කලේ කෙසේද? සාතන්ගේ පරීක්ෂාවන්ට විරුද්ධවීමට යාච්ඤාවෙන් අපට ශක්තිය ලැබෙන්නේ කෙසේද? මෙම

ශක්තිය ලබාගැනීමට අපට කළ හැකි වෙනත් දේවල් මොනවාද?

- ගිණිය නොහැකි තරම් ලෝකවල් දෙවියන්වහන්සේ අප වෙනුවෙන් සාදා තිබුනද, ඒවා සියල්ලම තමන්වහන්සේ දන්නා බව උන්වහන්සේ මෝසෙස්ට ස්ථිර කළසේක (මෝසෙස් 1:35). ස්වර්ගික පියාණන් සහ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ඔබව පුද්ගලිකව දැන ඔබට ප්‍රේමකරන බව දැනීමක් ඔබට ලැබුනේ කෙසේද?
- දෙවියන්වහන්සේගේ වැඩකටයුතු සහ මහිමය කුමක්දැයි අප දැනගැනීම වැදගත්වන්නේ මන්ද? මෙම ශ්‍රේෂ්ඨ කටයුතුවලදී උන්වහන්සේට උපකාරකිරීමට අපට හැකි යම් මාර්ග මොනවාද?

## "නුඹව තෝරාගෙන තිබෙන්නේ නුඹ ඉපදීමටත් පෙර සිටය" 2

*ආබ්‍රහම් 3; මෝසෙස් 4:1–4*

පහත සඳහන් ශුද්ධ ලියවිලි අධ්‍යයනය කරන්නඃ

අ. ආබ්‍රහම් 3:11–12, 22–23; දහම සහ ගිවිසුම 138:53–57. ආබ්‍රහම් ස්වාමීන්වහන්සේ සමග මුහුණට මුහුණ කථාකරමින් මැරෙන සුළු ජීවිතයට පෙර ජීවිතයේදී "ගෞරවනීය සහ ශ්‍රේෂ්ඨ" ආත්ම මෙම මැරෙන සුළු ජීවිතයේ ඔවුන්ගේ කාර්‍යයන් සඳහා පූර්ව නියමකළ බව දැනගනියි (ආබ්‍රහම් 3:11–12, 22–23). සභාපති ජෝසප් එෆ්. ස්මිත් ගැලවුම්කරුවාණන් මරණයෙන් නැවත නැගිටීමට පෙර ආත්ම ලෝකය බැහැදැකීම දර්ශනයක් තුලින් දැක "ගෞරවනීය සහ ශ්‍රේෂ්ඨ තැනැත්තන්" ගැන වැඩිදුර දැනගනියි. (ඩීසහසී 138:53–57).

ආ. ආබ්‍රහම් 3:24–28; මෝසෙස් 4:1–4. ස්වර්ගීය සම්මන්ත්‍රනය තුලදී යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අපගේ ගැලවුම්කරුවාණන් ලෙස තෝරාගත් බවත්, උන්වහන්සේව අනුගමනයකිරීම අප තෝරාගත් බවත්, ආබ්‍රහම් සහ මෝසෙස්ට දර්ශනයක් මගින් පෙන්වනු ලබයි. ලුසිෆර් (සාතන්) සහ ඔහුව අනුගමනය කළ ආත්ම ස්වර්ගයෙන් පළවාහැරිය බවද ඔවුන්ට පෙන්වනු ලබයි.

- සභාපති ජෝසප් එෆ්. ස්මිත් දුටු දර්ශනය තුලින් ආත්ම ලෝකයේදී ඔහු දුටුවේ කවුද? (බලන්න ඩීසහසී 138:53.) මේ පුද්ගලයන්ව පූර්ව නියම කළේ කුමක් කිරීම සඳහාද? (බලන්න ඩීසහසී 138:55–56.)
- අනාගතවක්තෘවරුන්ව කැඳවීම් සඳහා පූර්ව නියම කිරීමට අමතරව, දෙවියන්වහන්සේ "වෙනත් ශ්‍රේෂ්ඨ ආත්ම" බොහොමයක් උන්වහන්සේගේ රාජ්‍යය විවිධ අයුරින් ගොඩනැගීම සඳහා පූර්ව නියමකළ සේක. ඔබට කිරීම සඳහා පූර්ව නියම කළේ මොනවාද? (බලන්න ඩීසහසී 138:56.)
- ස්වර්ගීය සම්මන්ත්‍රනයේදී අපගේ ගැලවුම්කරුවාණන් වීම සඳහා ඉදිරිපත්වූ ආත්ම දෙක වූයේ කවරහුද? ආබ්‍රහම් 3:27; මෝසෙස් 4:1–2.) එම ඉදිරිපත්වීම්වල වෙනස කුමක්ද? ස්වර්ගික පියාණන් වහන්සේ අපගේ ගැලවුම්කරුවාණන් ලෙස යේසුස් ක්‍රිස්තුස්වහන්සේව තෝරාගත්තේ කුමක් නිසාද? (බලන්න මෝසෙස් 4:2–3.)

අමතර කියවීම්ඃ යෙසායා 14:12–15; එළිදරව් 12:7–9; ඇල්මා 13:3–5; දහම සහ ගිවිසුම 29:36–39; සහ ආබ්‍රහම් 3 ඉතිරි කොටස සහ දහම සහ ගිවිසුම 138.

## මැවීම

### *මෝසෙස් 1:27–42; 2–3*

## 3

පහත සඳහන් ශුද්ධ ලියවිලි අධ්‍යයනය කරන්නඃ

අ. මෝසෙස් 1:27–42. මෝසෙස් දෙවියන්වහන්සේගේ මැවීම ගැන දර්ශනයක් ලබන අතර, පොළොව මැවීම ගැන විස්තරයක් ලිවීමටද අණකරනු ලබයි.

ආ. මෝසෙස් 2:1–25; 3:1–14. සෑම දෙයකම මැවුම්කරුවාණන් දෙවියන්වහන්සේ බව මෝසෙස් දැනගනියි.

ඇ. මෝසෙස් 2:26–31; 3:7, 15–25. පුරුෂයන් සහ ස්ත්‍රීන් මවා තිබෙන්නේ දෙවියන් වහන්සේගේ ප්‍රතිරූපයෙන් බව මෝසෙස් දැනගනියි.

- මැවීමේ අරමුණ ගැන දෙවියන්වහන්සේ එළිදරව්කර තිබෙන්නේ මොනවාද? (බලන්න මෝසෙස් 1:39; ආබ්‍රහම් 3:24–25; තවද බලන්න 1 නිෆායි 17:36.)
- දෙවියන්වහන්සේගේ මැවීම්වලින් ඔබට විශේෂයෙන්ම අලංකාරවන්නේ කුමක්ද? හැම දිනකම මැවීමේ අලංකාරය ගැන ප්‍රවේශමෙන් බැලීම අපට ප්‍රයෝජනවත් වන්නේ කෙසේද?
- මැවීම දෙවියන්වහන්සේ ගැන “සාක්ෂි දරන්නේ” කෙසේද? (බලන්න මෝසෙස් 6:63; ඇල්මා 30:44.)

අමතර කියවීම්ඃ ආබ්‍රහම් 4–5; උත්පත්ති 1–2.

## “මාගේ වරද නිසා මාගේ ඇස් ඇරිනි”

### *මෝසෙස් 4; 5:1–15; 6:48–62*

## 4

පහත සඳහන් ශුද්ධ ලියවිලි අධ්‍යයනය කරන්නඃ

අ. මෝසෙස් 4; 5:10–11; 6:48–49, 55–56. සාතන් ආදම් උයනට පැමිණ ඒව රැවටීමට සොයයි. ඒව සහ ආදම් යහපත සහ නපුර දැනගැනීමේ ගසෙන් ගෙඩි කති (4:5–12). වැටීම නිසා ආදම් සහ ඒව ආදම් උයනෙන් පිටකරනු ලබයි (4:13–31). පසුව ආදම් සහ ඒව වැටීම තුලින් ලැබූ ආශිර්වාද වලින් සතුටුවෙති (5:10–11). වැටීමේ ප්‍රතිඵල ගැන ඒනොක් උගන්වයි (6:48–49, 55–56).

ආ. මෝසෙස් 5:14–15; 6:50–54, 57–62. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ වන්දිගෙවීම නිසා, නැවත නැගිටීම තුලින් මැරෙන සුළු මිනිසුන්ව ශාරීරික මරණයෙන් ගලවාගනු ලබන අතර, ඇදහිල්ල, පසුතැවීම, බව්තීස්මය, ශුද්ධාත්මයාණන්ගේ දීමනාව, සහ පණත්වලට කීකරුවීම තුලින් ආත්මික මරණයෙන්ද ඔවුන්ට ගැලවීම ලබාගත හැකිය.

ඇ. මෝසෙස් 5:1–9, 12. ආදම් සහ ඒව මැරෙන සුළු මිනිසුන් ලෙස ජීවිතය ආරම්භ කරති. ඔවුහු සිය දරුවන්ට සුභාරංචි සත්‍යයන් උගන්වති (5:1–4, 12). ආදම් සහ ඒව ඒක ජාතකයාණන්ගේ පරිත්‍යාගයට සමාන පරිත්‍යාග පුදකරති (5:5–9).

- ආදම් සහ ඒවට—සහ අපටද වැටීම නිසා ඇතිවූ ප්‍රතිඵල මොනවාද? (බලන්න මෝසෙස් 4:22–29; 5:10–11; 6:48–49, 55–56; 2 නිෆායි 2:22–23; 9:6; උත්පත්ති 3:16–23.)
- ආදම් සහ ඒවගේ වැටීම ගැන අනාගතවක්තෘවරුන් උගන්වන විටදී, ඔවුහු යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ වන්දිගෙවීම ගැනද නිතර උගන්වති (මෝසෙස් 5:10–15; 6:48–62; 2 නිෆායි 9:6–10). වැටීම සමග වන්දිගෙවීමද ඉගැන්වීම වැදගත් වන්නේ මන්ද?
- ආදම් පුදකළ පරිත්‍යාගවල අරමුණ කුමක්ද? (බලන්න මෝසෙස් 5:7–9.) අපට ලබාදෙන ඒ හා සමාන සිහි කැඳවීම් මොනවාද?

අමතර කියවීම්ඃ උත්පත්ති 2–3; 1 කොරොන්ති 15:20–22; 2 නිෆායි 2:5–30; 9:3–10; හීලමන් 14:15–18; දහම සහ ගිවිසුම 19:15–19; 29:34–44; ඇදහිල්ලේ කරුණු 1:2; —

## “නුඹ හොඳින් වැඩකළ හොත් නුඹ පිළිගනු ලබන්නෙහිය” 5

*මෝසෙස් 5–7*

පහත සඳහන් ශුද්ධ ලියවිලි අධ්‍යයනය කරන්නඃ

අ. මෝසෙස් 5:16–41. කේන් දෙවියන්වහන්සේට වඩා සාතන්ට ප්‍රේමකරමින්, ස්වාමීන්වහන්සේට පූජාවක් කිරීමට සාතන්ගේ අණට කීකරුවෙයි (5:16–19). ස්වාමීන්වහන්සේ කේන්ගේ පූජාව ප්‍රතික්ෂේපකර පසුතැවීම පිණිස කේන්ට අණකරනසේක (5:20–25). කේන් සාතන් හා ගිවිසුම්කර ආබෙල් මරාදමයි (5:26–33). ස්වාමීන්වහන්සේ කේන්ට ශාපකරනසේක, කේන්ව ස්වාමීන් වහන්සේගේ සම්මුඛයෙන් වසාදමනු ලබයි (5:34–41).

ආ. මෝසෙස් 6:26–63.ආදම්ගේ හතරවෙනි මුණුපුරාවන, ඒනොක්ව, පසුතැවීම දේශනාකිරීමට ස්වාමීන්වහන්සේ විසින් කැඳවනසේක (6:26–36). ඒනොක් ස්වාමීන්වහන්සේගේ අණ පිළිපදියි (6:37–63).

ඇ. මෝසෙස් 7:13, 17–21, 23–47, 68–69. ඒනොක්ගේ ඇදහිල්ල කෙතරම් විශාලද යත්, කඳු පහව යයි, ගංගා එහි ගමන් මහ වෙනස්කරයි, තවද සියලු ජාතීහු බියට පත්වෙති (7:13, 17). ස්වාමීන්වහන්සේ සහ ඒනොක් පොළොව මත ජනතාවගේ දුෂ්ටකම් නිසා වැළපෙති (7:23–47). ඒනොක් නගරයේ ජනතාව ස්වාමීන්වහන්සේ සමග එක් හදවතකින් සහ එක් මනසකින් යුතුවූ බැවින්, මුළු නගරයම ස්වර්ගයට ගෙනයනු ලබයි (7:18–21, 68–69).

- ආබෙල් කොහේදැයි ස්වාමීන්වහන්සේ විමසූවිට, කේන් ප්‍රතිචාර දැක්වූයේ කෙසේද? (බලන්න මෝසෙස් 5:34.) අපගේ සොහොයුරන්ගේ රැකවලා වීම යන්නෙහි අදහස කුමක්ද? (බලන්න 1 යොහාන් 3:11, 17–18.)
- ඒනොක් සහ ඔහුගේ ජනතාව සයෝනය ලෙස ස්වාමීන්වහන්සේ හැඳින්වූයේ මන්ද? (බලන්න මෝසෙස් 7:18.) ස්වාමීන්වහන්සේ සමග එක් හදවතක් සහ එක් මනසක් ඇතිව අපගේ පවුල් තුළ? සභාව තුල? සිටීමට අප කුමක් කළ යුතුද?

අමතර කියවීම්ඃ මෝසෙස් 5:42–55; 6:10–23; 7:14–16, 59–64; 2 නිෆායි 2:25–27; උත්පත්ති 4:1–16.

## “නෝවා . . . තම පවුලේ ගැලවීමට නැවක් සුදානම් කළේය” 6

*මෝසෙස් 8:19–30; උත්පත්ති 6–9; 11:1–9*

පහත සඳහන් ශුද්ධ ලියවිලි අධ්‍යයනය කරන්නඃ

අ. මෝසෙස් 8:19–30; උත්පත්ති 6:5–22; 7:1–10. නෝවා සුභාරංචිය උගන්වන නමුත්, ජනතාව ඇහුම්කන් නොදෙති (මෝසෙස් 8:19–25). ජනතාවගේ දුෂ්ටකම නිසා, පොළොවේ සියලු මාංශයන් විනාශකර දමන බව ස්වාමීන්වහන්සේ ප්‍රකාශකරති (මෝසෙස් 8:26–30; උත්පත්ති 6:5–13). ස්වාමීන්වහන්සේ නෝවාට අණකරමින්, නැවක් සාදා ඒ තුලට ඔහුගේ පවුල සහ ජීවත්වන සෑම දෙයකින්ම දෙදෙනෙකු බැගින් ගැනීමට කියනසේක (උත්පත්ති 6:14–22; 7:1–10).

ආ. උත්පත්ති 7:11–24; 8; 9:8–17. දහවල් 40ක් සහ රාත්‍රී 40ක් වැස්ස පවතියි (7:11–12). නැව තුල නොසිටි සියලු ජනතාව සහ සත්තු මියයති (7:13–24). ජලය බැසගිය පසු, නෝවා, ඔහුගේ පවුල සහ සතුන් නැවෙන් පිටවී යන අතර, නෝවා ස්වාමීන්වහන්සේට පූජාවක් පුදකරයි (8:1–22). ස්වාමීන්වහන්සේ නෝවා සමග තැබූ ගිවිසුම සංකේතවත් කරමින් දේදුන්නක් පිහිටුවනසේක (9:8–17).

ඇ. උත්පත්ති 11:1–9. ජලගැල්මෙන් පරම්පරා කිහිපයකට පසුව, ජනතාව ස්වර්ගය කරා කුළුනක් සෑදීමට උත්සාහ කරති. ස්වාමීන්වහන්සේ ඔවුන්ගේ භාෂාව ව්‍යාකූලකර,

ඔවුන්ව පොළොවේ සෑම තැනකම විසුරුවා හරිති.

- සුභාරංචිය දේනාකිරීමට ස්වාමීන්වහන්සේ නෝවා කැඳවූ විට, ලෝකය තිබුනේ කුමන තත්වයකද? (බලන්න මෝසෙස් 8:20–22.) නෝවාගේ කාලයේ ජනතාව සහ අපගේ කාලයේ ජනතාව අතර තිබෙන ඔබ දකින සමානකම් මොනවාද?
- නෝවාගේ කාලයේ ජනතාවට එම විනාශය වළක්වාගැනීමට හැකිව තිබුනේ කෙසේද? (බලන්න මෝසෙස් 8:23–24.) අනාගතවක්තෘ-වරුන්ට සවන්දී, ඔවුන්ව අනුගමනයකිරී-මෙන් අපට ආත්මික සහ ලෞකික විනාශය වළක්වාගත හැක්කේ කෙසේද?

නෝවා නැවක් සෑදුවේ මන්ද? (බලන්න හේබ්‍රෙව් 11:7.) අප වටා ඇති නපුරෙන් ගැල-වීමට අද අපට තිබෙන “නැව්” මොනවාද? (මෙම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා *තරුණ ශක්තිය සඳහා* [34285] පත්‍රිකාව බැලීමට ඔබට හැකිය.) මෙම “නැව්වල” සරණ සෙවීමට අන් අයට අප උපකාර කරන්නේ කෙසේද?

අමතර කියවීම්: හේබ්‍රෙව් 11:7; මෝසෙස් 7:32–36.

---

## ආබ්‍රහම් ගිවිසුම **7**

***ආබ්‍රහම් 1:1–4; 2:1–11; උත්පත්ති 12:1–8; 17:1–9***

ආබ්‍රහම් 1:1–4; 2:1–11; උත්පත්ති 12:1–8; 17:1–9 අධ්‍යයනය කරන්න. මෙම කොටස් තුලින් ආබ්‍රහම් ධර්මිෂ්ඨකම සහ දෙවියන්වහන්සේගේ ආශිර්වාදවලට සුදුසුවීම සොයයි. දෙවියන්ව-හන්සේ ආබ්‍රහම් සමග ගිවිසුම් තබමින්, ආබ්‍ර-හම්ට බොහෝ ජාතීන් ඇතිවන බවත්, ඔවුන්ට පොරොන්දු දේශයක් සහ පූජකවරයේ ආශිර්-වාද සමග සුභාරංචිය ලැබෙන බවටද පොරොන්දුවනසේක.

සභා සමාජිකයන් සියල්ලෝම ආබ්‍රහම්ගේ දරුවෝ වෙති, එහි අදහස අප ඔහුගෙන් පැව-තෙන අතර, අබ්‍රහම් ගිවිසුමේ ආශිර්වාද සහ වගකීම්වලට උරුමකම් කියන බවය. මෙම ශ්‍රේෂ්ඨ ආශිර්වාද අපට ලැබෙන්නේ අප සුභා-රංචි ගිවිසුම් තබන විටය. අප තබන පළමු ගිවිසුම වන්නේ බව්තීස්මයයි. පසුව අපට අබ්‍රහම් ගිවිසුමේ පූර්ණත්වය දේවමාළගාව තුලදී ලැබෙන්නේය.

- ආබ්‍රහම් ගිවිසුමේ කොටසක් ලෙස ස්වා-මීන්වහන්සේ ආබ්‍රහම්ට පොරොන්දුවූ ආශිර්වාද මොනවාද? (බලන්න ආබ්‍රහම් 2:6–11; උත්පත්ති 12:1–8; 17:1–9.)
- ආබ්‍රහම් ගිවිසුමේ උරුමක්කරුවන් ලෙස අපට තිබෙන වගකීම් මොනවාද? (බලන්න ආබ්‍රහම් 2:9, 11; උත්පත්ති 18:19.)

අමතර කියවීම්: දහම සහ ගිවිසුම 132:19–24, 29–32; උත්පත්ති 15.

---

## දුෂ්ඨ ලෝකයක ධර්මිෂ්ඨව ජීවත්වීම **8**

***උත්පත්ති 13–14; 18–19***

පහත සඳහන් ශුද්ධ ලියවිලි අධ්‍යයනය කරන්න:

අ. උත්පත්ති 13. කාලයක් මිසරයේ ජීවත්වීමෙන් පසුව, ආබ්‍රහම් සහ ඔහුගේ පවුල කනාන් දේශයට පැමිණෙති. ආබ්‍රහම් හේබ්‍රොන්හි වාසයකරන අතර, ඔහුගේ බෑණාවූ ලොත් සොදොම අසල වාසයකරයි.

ආ. උත්පත්ති 14:1–2, 8–24. ලොත්ව අල්වාගෙන යන අතර, ආබ්‍රහම් විසින් ගලවා ගනු ලබයි (14:1–2, 8–16). ආබ්‍රහම් මෙල්කිසදෙක්ට දසයෙන් කොටස ගෙවයි, තවද සොදොම්හි රජුගෙන් යුද්ධයෙහි කිසිවක් පිළිගැනීම ප්‍රතික්ෂේප කරයි (14:17–24).

ඇ. උත්පත්ති 18:16–33; 19:1–29. ජනතාවගේ දුෂ්-ඨකම නිසා සොදොම සහ ගොමෝරා

විනාශකරන බව ස්වාමීන්වහන්සේ කියනසේක (18:16–22). නගරවල ධර්මිෂ්ඨ මිනිසුන් ජීවත්වන්නේ නම්, එම නගර විනාශ නොකරන ලෙස ආබ්‍රහම් ස්වාමීන්වහන්සේට ආයාචනාකරයි (18:23–33). ලොත්ට සහ ඔහුගේ පවුලට සොදොමෙන් පිටවන ලෙසට අණකරනු ලබයි (19:1–23). ස්වාමීන්වහන්සේ සොදොම සහ ගොමෝරාව විනාශකරනසේක (19:24–29).

- මුලදී ලොත් සොදොමෙන් පිටත "සමභූමි නුවරවල වාසය කළේය", නමුත් ඔහු "තම කූඩාරම සොදොම දක්වා ගෙන ගියේය" (උත්පත්ති 13:12). පසුව ඔහු සොදොම තුලම වාසය කළේය (උත්පත්ති 14:12). අපගේ කූඩාරම් සොදොම දක්වා ගෙනයාමට සමාන වන අපට කළ හැකි ආත්මික දේවල් මොනවාද?

- ස්වාමීන්වහන්සේ සොදොම සහ ගොමෝරා විනාශකිරීමට යන බව ආබ්‍රහම් දැන ගත් විට ඔහු කීවේ කුමක්ද? (බලන්න උත්පත්ති 18:23–32.) ධර්මිෂ්ඨ ජනතාව නුවරවල සිටී නම් ස්වාමීන්වහන්සේ ඒවා ඉතිරිකරන සේක. එම කාරණය තුලින් අප කුමක් ඉගෙන ගන්නේද?

අමතර කියවීම්: උත්පත්ති 12; 19:9–15.

---

# "දෙවියන්වහන්සේම දවන පූජාවක් පිණිස බැටළු පැටවා සපයා ගන්නවා ඇත" 9

***ආබ්‍රහම් 1; උත්පත්ති 15–17; 21–22***

පහත සඳහන් ශුද්ධ ලියවිලි අධ්‍යයනය කරන්න:

අ. ආබ්‍රහම් 1:1, 5–20. අබ්‍රහම් තරුණ කාලයේදී, පාරාවෝගේ ව්‍යාජ පූජකයන් විසින් ඔහුට හිංසා කරනු ලබයි. ඔහුව දවන පූජාවක් කිරීමට ඔවුහු උත්සාහකරන නමුත්, යෙහෝවා වහන්සේ විසින් ඔහුව ගලවා ගනු ලබති.

ආ. උත්පත්ති 15–17; 21. පසුකාලයකදී, ආබ්‍රහම් දරුවන් ගැන පොරොන්දුවක් ලබයි (15:1–6). සාරා හාගර්ව ආබ්‍රහම්ගේ භාර්‍යාව ලෙස දෙයි; හාගර්ට ඉෂ්මායිල් පිළිසිඳ ගනියි (16:1–16). දෙවියන් වහන්සේ නැවතත් ආබ්‍රහම් සමග තමන්වහන්සේගේ ගිවිසුම් ගැන කථා කර, ආබ්‍රහම් ජාතීන් ගණනාවක පියෙක් වන බවට පොරොන්දුවනසේක (17:1–14). ඊෂාක්ගේ උපත නිවේදනය කෙරෙන අතර, ඔහු තුලින් ගිවිසුම දිගටම පවතිනු ඇත (17:16–22). සාරාට ඊෂාක්ව පිළිසිඳ ගනියි (21:1–12).

ඇ. උත්පත්ති 22. ඊෂාක්ව පූජාකරන ලෙස දෙවියන්වහන්සේ ආබ්‍රහම්ට අණකරනසේක (22:1–2). ඊෂාක්ව පූජාකිරීමට ආබ්‍රහම් සූදානම්වන නමුත්, දෙවියන්වහන්සේ ඒ වෙනුවට පූජාකිරීමට බැටළුවෙකු ලබාදෙනසේක (22:3–19).

සටහන: ආබ්‍රම්ගේ නම ආබ්රහම් ලෙසත්, සාරයිගේ නම සාරා ලෙසත් (ස්වාමීන්වහන්සේ වෙනස් කළ බව උත්පත්ති 17 සඳහන් වේ (බලන්න පද 5 15). ආබ්‍රහම් සහ සාරා යන නම් මෙම කොටස මුළුල්ලේම භාවිතාවේ.

- ඊෂාක්ව පූජාකිරීමට දෙවියන්වහන්සේ දුන් අණකිරීමට ආබ්‍රහම් ප්‍රතිචාර දැක්වූයේ කෙසේද? (බලන්න උත්පත්ති 22:2–3.) මෙම අවස්ථාවට ඊෂාක් ප්‍රතිචාර දැක්වූයේ කෙසේද? (බලන්න උත්පත්ති 22:3–10.) ඇදහිල්ල සහ කීකරුකම ගැන ආබ්‍රහම් සහ ඊෂාක්ගෙන් අපට ඉගෙනගත හැක්කේ මොනවාද? (බලන්න හෙබ්‍රෙව් 11:17–19; යාකොබ් 2:21–23.)

- ඊෂාක් පූජාකිරීමට ආබ්‍රහම්ගේ කැමැත්ත ස්වර්ගික පියාණන්වහන්සේ සිය ඒකජනක පුත්‍රයාණන් පූජාකිරීමට දැක්වූ කැමැත්තට සමානය (යාකොබ් 4:5; උත්පත්ති 22:8, 13). ආබ්‍රහම්ගේ සහ ස්වර්ගික පියාණන්වහන්සේගේ අත්දැකීම් අතර තිබෙන යම් සමානකම් මොනවාද? විශාලතම වෙනස්කම කුමක්ද?

අමතර කියවීම්: හෙබ්‍රෙව් 11:8–19; යාකොබ් 2:21–23; ජාකොබ් 4:5; දහම සහ ගිවිසුම 132:34–36.

## කුළුඳුල් බවේ ආශිර්වාද; ගිවිසුම තුල විවාහය
**10**

*උත්පත්ති 24–29*

පහත සඳහන් ශුද්ධ ලියවිල අධ්‍යයනය කරන්නː

අ. උත්පත්ති 24. ඊෂාක්ට සුදුසු භාර්යාවක් තෝරාගැනීමේදී ගිවිසුම තුල විවාහයක වැදගත්කම ගැන ආබ්‍රහම් අවධාරණය කරයි.

ආ. උත්පත්ති 25:20–34. තම නිවුන් පුතුන් ගැන රෙබෙකාට එළිදරව්වක් ලැබෙයි (25:22–23). මෙම පුතුන් වැඩෙන විට, ඒසව් සිය කුළුඳුල්බව ජාකොබ්ට විකුණයි (25:29–34).

ඇ. උත්පත්ති 26–29. ඊෂාක් සහ ඔහුගේ පැවතෙන්නන්ට අබ්‍රහම් ගිවිසුමේ ආශිර්වාද පොරොන්දු වෙයි (26:1–5). ඒසව් ගිවිසුමෙන් පිටත විවාහවෙයි (26:34–35). ජනතාව සහ ජාතීන් පාලනය කිරීමට ඊෂාක් ජාකොබ්ට ආශිර්වාද කරයි (27:1–46). ඊෂාක් යාකොබ්ට ආබ්‍රහම් ගිවිසුමේ ආශිර්වාද ප්‍රකාශකර, සුදුසු භාර්යාවක් සොයාගැනීමට පිටත්කර යවයි (28:1–10). යාකොබ් ගිවිසුම තුල ලෙයා සහ රාකෙල් හා විවාහවෙයි (29:1–30).

- අපගෙන් සමහරෙක් සදාකාලික වටිනාකමක් ඇති දේවල් වෙනුවට ඒසව් කළාක් මෙන් ක්ෂණික සතුටක් ලැබෙන වැරදි දේවල් තෝරාගන්නේ කෙසේද?
- ගිවිසුම තුල විවාහවීමට යාකොබ් ගත් උත්සාහය තුලින් අපට ඉගෙනගත හැක්කේ මොනවාද? (බලන්න උත්පත්ති 28:1–5; 29:1–28.)
- දේවමාළිගාවේ විවාහවීම සඳහා සූදානම්වීමට ළමයින් සහ තරුණ අයට කළ හැකි යම් දේවල් මොනවාද? දෙදෙනෙක් දේවමාළිගාව තුල විවාහවීමෙන් පසුව, ඔවුන් සත්‍ය ලෙසම සදාකාලික විවාහයක් වූ බව තහවුරුකර ගැනීමට ඔවුන් කළ යුතු දේවල් මොනවාද?

## "මම මේ මහත් දුෂ්ටකම කෙසේ කරන්නෙම්ද?"
**11**

*උත්පත්ති 34; 37–39*

පහත සඳහන් ශුද්ධ ලියවිලි අධ්‍යයනය කරන්නː

අ. උත්පත්ති 37. යාකොබගේ එකොළොස්වෙනි පුත්‍රයා වන, යොසෙප්, ඔහුගේ සොහොයුරන් විසින් වෛරකරනු ලැබ, වහල්කමට විකුණනු ලබයි.

ආ. උත්පත්ති 39. යොසෙප් වහල්කමේ සිටියදී සමෘද්ධිමත්වන නමුත්, දුරාචාරය ගැන චෝදනා ලැබ සිරගෙට යවයි (39:1–20). සිරගෙදර නායකයා සිරගෙදර අනෙක් සිරකරුවන්ගේ වගකීම යොසෙප්ට බාරදෙයි (39:21–23).

ඇ. උත්පත්ති 34:1–12; 35:22; 38:1–30. දුරාචාරයේ පාපයෙන් යාකොබ්ගේ පවුල වෙත ප්‍රති විරුද්ධ ප්‍රතිඵල ගෙන දෙයි (34:1–12; 35:22; 38:1–30).

යාකොබ්ගේ භාර්යාවෝ ඔහුට දාව පුතුන් දෙළොස් දෙනෙක් බිහිකරති. ඔවුහු ඉශ්‍රායෙල් ගෝත්‍ර දොළොසේ ආරම්භකරුවන් බවට පත් වෙති. (ස්වාමීන්වහන්සේ ජාකොබ්ගේ නම ඉශ්‍රායෙල් ලෙස වෙනස්කරනසේක; බලන්න උත්පත්ති 32:28). යාකොබ්ගේ එකොළොස් වෙනි පුත්‍රයා යොසෙප්ය; යාකොබ් සහ රාබෙල්ගේ වැඩිමහල් පුත්‍රයා ලෙස, යොසෙප්ට කුළුඳුල් බව ලැබුනේ, යාකොබ් සහ රාබෙල්ගේ වැඩිමහල් පුත්‍රයාවූ රූබන්, අධර්මිෂ්ඨකම තුලින් එය අහිමිකරගත් නිසාය (1 ලේකම් 5:1–2).

- පෝතිපර්ගේ භාර්යාව යොසෙප්ව පාපයට පෙළඹවීමට උත්සාහකළ විට ඔහු කළේ කුමක්ද? (බලන්න උත්පත්ති 39:11–12.) අප පෙළඹවීමක් ලබන විට යොසෙප්ගේ ආදර්ශය අප අනුගමනය කරන්නේ කෙසේද?
- අයහපත් අත්දැකීම් සහ අවස්ථාවන් යහපත් දේවලට පත්කිරීම සඳහා අපට යොසෙප්ගෙන් ඉගෙනගත හැක්කේ මොනවාද? (බලන්න උත්පත්ති 39:20–23; තවද බලන්න රෝම 8:28.)

අමතර කියවීම්ː උත්පත්ති 34:13–31.

## “මාගේ පීඩාවේ දේශයේදී සඵලවීම” 12

*උත්පත්ති 40–45*

පහත සඳහන් ශුද්ධ ලියවිලි අධ්‍යයනය කරන්නː

අ. උත්පත්ති 40–41. සිරගෙදරදී, යොසෙප් ඵාරාවෝගේ සේවකයන්ගේ සිහින නිවැරදිව තෝරා දෙයි. ඉන්පසුව ඔහු ඵාරාවෝගේ එළදෙනුන් සහ ගොයම් සිහිනය තෝරාදෙයි. යොසෙප්ව ඵාරාවෝ යටතේ මුළු මිසරයේම පාලකයා කරන අතර, ඔහු ජනතාව සාගතයට සූදානම් කරයි.

ආ. උත්පත්ති 42–45. ජාකොබ් ධාන්‍ය මිළදී ගැනීම සඳහා ඔහුගේ පුත්‍රයන්ව දෙවරක්ම මිසරයට යවයි. යොසෙප් තමාව ඔහුගේ සොහොයුරන්ට හඳුන්වා දී ඔවුන්ට කමාවදෙන අතර, ඔවුහු එක්ව සතුටුවෙති.

- යොසෙප්ගේ සොහොයුරන් ඔහුට කලාක් මෙන්, යමෙක් අපට වරදක් කළ විට ලෝකයා අපට කිරීමට කියන්නේ කුමක්ද? අපට කිරීමට ස්වාමීන්වහන්සේ කුමක් කියන සේක්ද? (බලන්න ඩීසහගී 64:8–11.) ඔබට වැරදි ලෙස සැළකූ අන් අයට ඔබ කරුණාවෙන් සැළකූ විට ඔබ ආශිර්වාදිතවූයේ කෙසේද? අප වැඩියෙන් කමාව දෙන්නන් බවට පත්වන්නේ කෙසේද?
- යොසෙප් වරදකරුවෙකු ලෙස මිසරයේ සිරගතවීම, ඔහුටද, ඔහුගේ පවුලට, සහ මුළු මිසරයටම ආශිරවාදයක් වූයේ කෙසේද? (බලන්න උත්පත්ති 45:4–8.) ප්‍රථමයෙන් අසුභවාදී ලෙස පෙනුන සිද්ධීන් පසුව ආශිර්වාද බවට පත්වූ ඔබට තිබෙන අත්දැකීම් මොනවාද?

අමතර කියවීම්ː 2 නිෆායි 2:2; දහම සහ ගිවිසුම 64:8–11; 122:5–9.

## වහල්බව, පාස්කුව, සහ නික්මයාම 13

*නික්මයාම 1–3; 5–6; 11–14*

පහත සඳහන් ශුද්ධ ලියවිලි අධ්‍යයනය කරන්නː

අ. නික්මයාම 1–3. මිසරවාසීන් විසින් ඉශ්‍රායෙල්වරුන්ව වහලුන් කරනු ලබයි (1:1–14). ඉශ්‍රායෙල්වරුන්ට උපදින සියලුම පුත්‍රයන් මරාදැමීමට ඵාරාවෝ නියෝග කරයි (1:15–22). මෝසෙස් ඉපදී, ඵාරාවෝගේ දියණියක් විසින් ඇතිදැඩි කරනු ලබයි (2:1–10). ස්වාමීන්වහන්සේ ගිනිගත් පඳුර ළඟදී මොසෙස්ට ප්‍රකාශවී, ඉශ්‍රායෙල්ව වහල්කමින් මුදාගැනීමට ඔහුව කැඳවනසේක (3:1–22).

ආ. නික්මයාම 5–6. ඉශ්‍රායෙල්වරු නිදහස්කරන ලෙස මෝසෙස් සහ ආරොන් ඵාරාවෝගෙන් ඉල්ලන නමුත්, එය ප්‍රතික්ෂේපකරන ඵාරාවෝ ජනතාව මත විශාල ලෙස බර පටවයි (5:1–23). ස්වාමීන්වහන්සේ ආබ්‍රහම් සමග තැබූ ගිවිසුම ඉටුකරන බවට පොරොන්දුවනසේක (6:1–8).

ඇ. නික්මයාම 11–13. මිසරයට බොහෝ වසංගත යැවීමෙන් පසුව, ඔවුන්ට තවත් එක් වසංගතයක් යවන බවට ස්වාමීන්වහන්සේ පොරොනදුවන සේක, එමගින් සෑම නිවසකම කුළුඳුලා මියයනු ඇත (11:1–10). පාසකුවට සූදානම්වීම ගැන ස්වාමීන්වහන්සේ මෝසෙස්ට උපදෙස් දෙන අතර, එමගින් ඉශ්‍රාලේවරුන්ව වසංගතයෙන් ආරාක්ෂාවනු ඇත (12:1–20). මිසරයේ කුළුඳුලෝ මරා දැමෙති (12:29–30). සිය ජනතාව රැගෙන මිසරයෙන් යන ලෙස ඵාරාවෝ මෝසෙස්ට කියන අතර, ඉශ්‍රායෙල්වරු පිටවී යති (12:31–42). මෝසෙස් ඉශ්‍රායෙල් දරුවන් අමතා ඔවුන්ගේ ගැලවීමේ ස්මරණයක් ලෙස මුහුන් නොකළ රොටි සැමරීමේ උත්සවය පැවැත්වීමට ඔවුන්ට කියයි (13:1–16). ස්වාමීන්වහන්සේ ඉශ්‍රායෙල්වරුන්ගේ කූඩාරම ඉදිරිපිටින් දහවලේදී වළාකුලක් ලෙසද, රාත්‍රියේදී ගිනි කුළුනක් ලෙසද යනසේක (13:17–22).

ඈ. නික්මයාම 14. ඵාරාවෝ සහ හමුදාව ඉශ්‍රායෙල් හඹා යති (14:1–9). ජනතාව බියවන අතර, මොසෙස් ස්වාමීන්වහන්සේගෙන් උදව් ඉල්ලයි (14:10–18). ඉශ්‍රායෙල්වරු වියලි පොළොව මතින් රතු මුහුද තරණයකරන අතර, ඔවුන් හඹාගිය ඵාරාවෝගේ මිනිස්සු මුහුදේ ගිලෙති (14:19–31).

- අවසාන රාත්‍රී භෝජන සංග්‍රහයේදී, ගැලවුම්කරුවාණන්වහන්සේ පාස්කුව වෙනුවට සක්‍රමේන්තුව පිහිටුවූසේක (මතෙව් 26:19, 26–28) පාස්කුව සහ සක්‍රමේන්තුව අතර තිබෙන සමානකම් මොනවාද? (බලන්න නික්මයාම 12:14; 13:9–10; ඩීසහසී 20:75–79.)

- ඉශ්‍රායෙල් දරුවන් පාරාවෝගේ හමුදාව දැක, ඔවුන් ඇදහිල්ලෙන් පැකිලුන විට, මෝසෙස් ඔවුන්ට කීවේ කුමක්ද? (බලන්න නික්මයාම 14:13–14.) අප තදින්ම බියට පත්වන විට අපව දරාසිටීමට ප්‍රමාණවත් ශක්තියක් අප ඇතිකරගැනීමට ඇදහිල්ල දියුණුකරගන්නේ කෙසේද?

- මිසර හමුදාවෙන් ඉශ්‍රායල් දරුවන්ව ස්වාමීන්වහන්සේ ගලවා ගත්තේ කෙසේද? (බලන්න නික්මයාම 14:21–31.) පරීක්ෂන අවස්ථාවලදී අපට මෙම කථාව උපකාරවත් වන්නේ කෙසේද?

අමතර කියවීම්: නික්මයාම 4; 7–10; 15.

---

## "නුඹලා මට අසහාය වස්තුවක් වන්නහුය" 14

***නික්මයාම 15–20; 32–34***

පහත සඳහන් ශුද්ධ ලියවිලි අධ්‍යයනය කරන්න:

අ. නික්මයාම 15:22–27; 16:1–31; 17:1–7. පිපාසය සහ කුසගින්න නිසා ඉශ්‍රායෙල් දරුවෝ මැසිවිලි කියති; ස්වාමීන්වහන්සේ ඔවුන්ට ජලය, මන්නා සහ වටුවන් ලබාදෙනසේක.

ආ. නික්මයාම 17:8–13; 18:13–26. අමලෙක්වරු ඉශ්‍රායෙල්ට පහරදෙති. මෝසෙස් සිය අත් ඔසවන විට ඉශ්‍රායෙල් ජයගනිති, නමුත් මෝසෙස් වෙහෙසට පත්ව ඔහුගේ අත් පහත්කරන විට අමලෙක්වරු ජයගනිති. ආරොන් සහ හර් මෝසෙස්ගේ අත් ඔසවා තබාගැනීමෙන් ඉශ්‍රායෙල්වරු සටන ජයගනිති (17:8–13). මෝසෙස් විනිශ්චයකරුවන් පත්කර ඔවුන්ට අධිකාරී බලය පවරයි (18:13–26).

ඇ. නික්මයාම 19–20. ස්වාමීන්වහන්සේ සිනායි කන්ද මුදුනේදී මෝසෙස් හමුවී ඉශ්‍රායෙල්වරුන්ට දස පණත දෙනසේක.

ඈ. නික්මයාම 32–34. ස්වාමීන්වහන්සේගේ උපදෙස් සහිත ගල් ලෑලි මෝසෙස්ට ලැබෙන නමුත්, මිනිසුන් රන් වස්සාට නමස්කාරකිරීම දැක ලෑලි කඩා දමයි (31:18; 32:1–24). මෙල්කිසදෙක් පූජකවරයේ නියෝග ඉශ්‍රායෙල් වෙතින් ලබාගන්නා ස්වාමීන්වහන්සේ ඔවුන්ට කුඩා නීතියක් වන, මෝසෙස්ගේ නීතිය ලබාදෙන සේක. මෝසෙස් අළුත් ගල් ලෑලි කපන නමුත්, අළුත් ලෑලිවල "ශුද්ධවූ පූජකවරයේ සදාකාලික ගිවිසුමේ වචන" එහි ඇතුලත් නොවේ (නික්මයාම 34:1–5). මෝසෙස්ගේ නීතියට කීකරුවීමට ජනතාව ගිවිසුම් කරති (34:10–35).

- මන්නා ක්‍රිස්තුස්වහන්සේව නියෝජනකරන්නේ කෙසේද? (බලන්න යොහාන් 6:35.) ක්‍රිස්තුසවහන්සේගේ ජීවනදායක රොටී මන්නාවලින් වෙනස්වන්නේ කෙසේද? (බලන්න යොහාන් 6:48–51.) අප දිනපතාම ක්‍රිස්තුස්වහන්සේගේ ජීවනදායක රොටී භුක්තිවිඳින්නේ කෙසේද?

- ඉශ්‍රායෙල් දරුවන් කීකරුව සිටින්නේ නම්, ස්වාමීන්වහන්සේ ඔවුන්ට පොරොන්දුවූයේ මොනවාද? (බලන්න නික්මයාම 19:3–6.) මෙම පොරොන්දු අද අපට අදාළවන්නේ කෙසේද?

- ස්වාමීන්වහන්සේ ඉශ්‍රායෙල් දරුවන්ට මෝසෙස්ගේ නීතිය දුන්නේ මන්ද? (බලන්න ගලාති 3:23–24; මොසායා 13:29; ඇල්මා 25:15–16; ඩීසහසී 84:19–27.) මෙම නීතිය මගින් ඉශ්‍රායෙල් වරුන් ශුද්ධවන්තකර, ඔවුන්ව ක්‍රිස්තුස්වහන්සේ වෙත

පමුණුවන්නේ කෙසේද? (බලන්න මොසායා 13:30; ඇල්මා 34:14–15.)

- මෝසස්ගේ නීතිය ඉටුවුනේ කවදාද? (බලන්න 3 නිෆායි 15:4–10.) දැන් ස්වාමීන්වහන්සේට සතුන් පූජාකිරීම තවදුරටත් අවශ්‍ය නොවන බැවින්, මෝසෙස්ගේ නීතියේ වැදගත් කොටස කුමක්ද, උන්වහන්සේ අපගෙන් ඉල්ලන පූජාව කුමක්ද? (බලන්න 3 නිෆායි 9:19–22.) බිඳුන සිතක් සහ පසුතැවිලි ආත්මයක් පුදකිරීම යන්නෙහි අදහස කුමක්ද?

අමතර කියවීම්: ගීතිකා 78; 1 කොරොන්ති 10:1–11; දහම සහ ගිවිසුම 84:19–27.

---

## "දෙවියන්වහන්සේ දෙස බලා ජීවත්වන්න" 15

***ගණන් කථාව 11–14; 21:1–9***

පහත සඳහන් ශුද්ධ ලියවිලි අධ්‍යනය කරන්නː

අ. ගණන් කථාව 11. මන්නා ගැන චෝදනාකරන ඉශ්‍රායෙල්වරු මස් කෑමට ආශාකරති (11:1–9). ස්වාමීන්වහන්සේගේ උපදෙස් පරිදි, ඔහුට සහයෝගය දීම සඳහා මෝසෙස් වැඩිමහල්ලන් 70 දෙනෙකු එකතුකරයි (11:10–17, 24–30). ස්වාමීන්වහන්සේ ඉශ්‍රායෙල්වරුන්ගේ ආශාවට පිළිතුරු ලෙස, වටුවන් ඉතා බහුල ලෙස ඔවුන් වෙත එවමින් ඔවුන්ගේ කෑදරකම සහ දැඩි කැමැත්ත නිසා ඔවුන්ට වසංගතයකින් පහර ගසනසේක (11:18–23, 31–35).

ආ. ගණන් කථාව 12. මීරියම් සහ ආරොන් මෝසෙස්ට විරුද්ධව කථාකරති (12:1–3). ඔවුන්ගේ කෙඳිරිලි නිසා ස්වාමීන්වහන්සේ මීරියම්ට සහ ආරොන්ට තරවටුකරමින් දඬුවම් කරනසේක (12:4–16).

ඇ. ගණන් කථාව 13–14. මෝසෙස් මිනිසුන් 12 දෙනෙකුට කනාන් දේශය සෝදිසිකිරීමට උපදෙස් දෙයි (13:1–20). ඔවුහු දේශයේ මූලාශ්‍රවල සතුටුදායක වාර්තා රැගෙන නැවත පැමිණෙති. නමුත් යොෂුවා සහ කාලෙබ් එහි වැසියන්ට බියවී නැවත මිසරයට යාමට කැමතිවූහ (13:21–14:10). ස්වාමීන්වහන්සේ මෝසෙස් අමතා ඇදහිලිමත් නොවන සහ චෝදනාකරන ඉශ්‍රායෙල්වරුන් සියලුම වැඩිහිටි පරම්පරා, යොෂුවා සහ කාලෙබ් හැර අනෙක් අය, මිය යන තුරු වසර 40ක් කාන්තාරයේ අතරමංවන බව කීසේක (14:11–39).

ඈ. ගණන් කථාව 21:1–9. ඉශ්‍රායෙල්වරු තමන්ට විරුද්ධව එන කනාන්වරුන්ව විනාශකරති (21:1–3). ඉශ්‍රායෙල්වරුන්ගේ නිරන්තර චෝදනා නිසා දඬුවමක් ලෙස ස්වාමීන්වහන්සේ ගිනි සර්පයන් එවනසේක (21:4–6). මෝසෙස් පිත්තල සර්පයෙක් සාදා, එය ලීයක අමුනා, ජනතාව උෟ දෙස බැලුව හොත්, ඔවුන් ජීවත්වන බව කියයි (21:7–9).

- ඉශ්‍රායෙල්වරු මන්නා ගැන චෝදනා කළේ මන්ද? (බලන්න ගණන් කථාව 11:4–6.) අපට තිබෙනවාට වඩා ආශාවීමේ අනතුරු මොනවාද?
- ජීවත්වීම සඳහා ඉශ්‍රායෙල් දරුවන්ට පිත්තල සර්පයා දෙස බැලීමට අවශ්‍යවූවාක් මෙන්, සදාකාලික ජීවනය ලබාගැනීමට යේසුස් ක්‍රිස්තුස්වහන්සේ දෙස බැලීම අපටද අවශ්‍යවේ (ඇල්මා 37:46–47; හීලමන් 8:15). ක්‍රිස්තුස්වහන්සේ දෙස බැලීම යන්නෙහි අදහස කුමක්ද?

අමතර කියවීම්: යොහාන් 3:14–16; 1 නිෆායි 17:41; ඇල්මා 33:18–22; 37:46–47; හීලමන් 8:13–15.

# “මාගේ ස්වාමීන්වහන්සේගේ වචනය ඉක්මවා යෑමට මට නොහැකිය” 16

*ගණන් කථාව 22–24; 31:1–16*

පහත සඳහන් ශුද්ධ ලියවිලි අධ්‍යයනය කරන්න:

අ. ගණන් කථාව 22:1–21. මෝවබ් රජතුමා වන බාලාක්, ඉශ්‍රායෙල්වරුන්ගේ පැමිණීම මගින් මහත් බියට පත්විය. ඉශ්‍රායෙල්වරුන්ට ශාපකිරීම සඳහා මෝවබ් දේශයට බාලාම් පැමිණෙන්නේ නම් ඔහුට තෑගි දෙන බව ඔහු කීවේය. එය ප්‍රතික්ෂේපකිරීමට දෙවියන්වහන්සේ බාලාම්ට අණකළ අතර බාලාම් කීකරුවෙයි (22:1–14). ඉශ්‍රායෙල්වරුන්ට ශාපකිරීමට මොවාබ් දේශයට එන්නේ නම් බාලාම්ට අමතර ගෞරවයක් සහ වස්තුව පිරිනමන බව බලාක් කියයි. බාලාම් කැමති නම් ඔහුට යා හැකි නමුත්, ඔහු කථාකල යුත්තේ දෙවියන්වහන්සේ ඔහුට දෙන වචන පමණක් බවත් දෙවියන්වහන්සේ ඔහුට කියනසේක (22:15–21). එහි යෑමට බාලාම් තීරණය කළේය.

ආ. ගණන් කථාව 22:22–35. බාලාක් ගෙන් තෑගි බලාපොරොත්තුව බාලාම් මොවාබ් දේශයට යෑම ගැන දෙවියන්වහන්සේ ඔහු හා අමනාපවනසේක. ඔහු ගමන්කරන අතර, ඔහුගේ කොටළු දෙන සහ දේවදූතයෙක් කථාකරන විට, දෙවියන්වහන්සේ අසතුටුවීමේ අනතුර ගැන බාලාම් දැන ගනියි.

ඇ. ගණන් කථාව 22:36–24:25. ඉශ්‍රායෙල්ට ශාපකරන ලෙස බාලාක් තුන් වතාවක්ම බාලාම්ට කියයි, නමුත් බාලාම් දේවියන්වහන්සේට කීකරුව හැම වතාවකම ඉශ්‍රායෙල්ට ආශිර්වාද කරයි (22:36–24:9). ඉන්පසුව ඔහු මෝවබ්ට ශාපකර යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැන අනාවැකි කියයි (24:10–25).

ඈ. ගනන් කථාව 31:1–16. ඉශ්‍රායෙල්වරු මිදියන්වරුන්ව විනාශකර, බාලාම් මරාදති. මෝසෙස් පැහැදිළිකරමින්, ඉශ්‍රායෙල්වරුන්ව පාපයට පෙළඹවීමට බාලාම් මිදියන්වරුන්ට උපදෙස් දුන් බව කියයි. (බාලාම්ගේ උපදෙස්වල ප්‍රතිවිපාක ගැන ගණන් කථාවේ 25:1–3 විස්තරවෙයි. ඉශ්‍රයෙල්වරුන්ට කෙළින්ම ශාපකිරීමට බාලාම් අකමැති වුවද, ඔහුට බාලාක්ගේ තෑගි තදින්ම අවශ්‍යවූ නිසා, ඉශ්‍රායෙල්ට තිබූ දේව ආරක්ෂාව නැතිකිරීමට ඉශ්‍රායෙල් පාපයට පෙළඹවීමට ඔහු යෝජනා කළේය.)

- ඉශ්‍රායෙල්ට ශාපකිරීම සඳහා මොවාබ් දේශයට යාම වෙනුවට හුවමාරුවක් ලෙස තෑගි පිරිනැමීම ගැන බාලාම් ප්‍රතිචාර දැක්වූයේ කෙසේද? (බලන්න ගණන් කථාව 22:5–14.) දෙවියන්වහන්සේට අකීකරුවීම වෙනුවට අප සමහර අවස්ථාවලදී හුවමාරුකරන තෑගි මොනවාද?
- බාලාම් මොවාබ් බලා යන අතර, තුන් වරක්ම තම කොටළු දෙනට ඉදිරියට යාමට බල කරයි (ගණන් කථාව 22:22–30). මෙය බාලාම් සහ දෙවියන්වහන්සේ අතර සම්බන්ධතාවයට බලපාන්නේ කුමන ආකාරයෙන්ද? යම් පුද්ගලයන් සහ කණ්ඩායම් දෙවියන්වහන්සේගේ කැමැත්තට හෝ දෙමාපියන්ගේ හෝ නායකයන්ගේ ධර්මිෂ්ඨ උපදෙස්වලට යටත් නොවී මුරණ්ඩුවන නූතන සමානකම් කිහිපයක් මොනවාද?
- අළුත් ගිවිසුමේ කතුවරුන් තිදෙනෙක් බාලාම් ගැන සඳහන් කරති (2 පේත්‍රුස් 2:15–16; යූද් 1:11; එළිදරව් 2:14). ඔහු ගැන ඔවුන්ට තිබෙන හැඟීම් මොනවාද? බාලාම්ගේ කථාවෙන් අපට ඉගෙනගත හැකි පාඩම් මොනවාද?

## “අමතක නොකිරීමට වගබලා ගනින්න” 17

*ද්වීතීය කථාව 6; 8; 11; 32*

පහත සඳහන් ශුද්ධ ලියවිලි අධ්‍යයනය කරන්නඃ

අ. ද්වීතීය කථාව 6:1–9; 11:18–21. මෝසෙස් ඉශ්‍රායෙල්වරුන්ට උපදෙස් දෙමින් ඔවුන්ගේ ගිවිසුම් සිහිපත්කරගැනීමට උපකාර කරයි. ඔහු දරුවන්ට ඔහුගේ වචන ඉගැන්වීමට දෙමාපියන්ට උපදෙස් දෙයි.

ආ. ද්වීතීය කථාව 6:10–12; 8:1–20. මෝසෙස් ඉශ්‍රායෙල්වරුන්ට දේව ආශිර්වාද ගැන සිහිපත්කරයි. ඔවුන් දෙවියන්වහන්සේගේ පණත්වලට අකීකරුව, උන්වහන්සේ සිහිපත් නොකරන්නේ නම්, ඔවුන් විනාශවන බවට ඔහු අනතුරු අඟවයි.

ඇ. ද්වීතීය කථාව 32:1–4, 15–18, 30–40, 45–47. මෝසෙස් ඉශ්‍රායෙල්ට උපදෙස් දෙමින් ඔවුන්ගේ ගැලවීමේ පර්වතය වන (යේසුස් ක්‍රිස්තුස්වහන්සේ) සිහිකිරීමට කියයි.

වසර 40ක කාලයක් වනාන්තරය තුලදී ඉශ්‍රායෙල්වරුන් පරීක්ෂාකරමින්, තරවටුකරමින්, සහ ඉගැන්වීමෙන් පසුව, පොරොන්දු දේශයට ඇතුල්වීමට ඔවුන් සූදානම්බව ස්වාමීන්වහන්සේ කීසේක. නමුත් පළමුව ඔවුන් සඳහා යම් වැදගත් උපදෙස් කිහිපයක් උන්වහන්සේට තිබින. මෝසෙස් දේශනා තුනකින් ප්‍රකාශකළ මෙම උපදෙස් ද්වීතීය කථාවේ වාර්තාකර ඇත.

- ජනතාව ශුද්ධ ලියවිලි කොටස් ඔවුන්ගේ ඇස් ඉදිරිපිට, ඔවුන්ගේ අත්වල, ඔවුන්ගේ නිවාසවල කණුවල, සහ ඔවුන්ගේ දොරටුවල තබාගැනීමට මෝසෙස් ඔවුන්ට කීම ගැන ඔබ සිතන්නේ කුමක්ද? එවැනි නිරන්තර සිහිගැන්වීම් අපගේ ක්‍රියාවලට බලපාන්නේ කෙසේද? ස්වාමීන්වහන්සේ, උන්වහන්සේගේ වචන, සහ අප උන්වහන්සේ හා තැබූ ගිවිසුම් සිහිපත්කිරීමට අපගේ නිවාස තුල අපට කළ හැකි දේවල් මොනවාද? අපගේ බිත්තිවල තිබෙන පින්තූර, අප කියවන පොත්, චිත්‍රපට සහ අප බලන රූපවාහිනී දර්ශන ස්වාමීන්වහන්සේව අපට සිහිපත් කරන්නේද, නැතහොත් එමගින් ලෝකයට ආශාවක් අප තුල ඇතිවන්නේද?
- ද්වීතීය කථාවේ 6:10–12 and 8:1–20 එන මෝසෙස්ගේ ප්‍රධාන පණිවුඩ මොනවාද? ස්වාමීන්වහන්සේව අමතක කිරීම යන්නෙහි අදහස කුමක්ද? (බලන්න ද්වීතීය කථාව 8:11.) උන්වහන්සේව අමතක කිරීමේ විපාක මොනවාද? (බලන්න ද්වීතීය කථාව 8:19.)
- ද්වීතීය කථාවේ සඳහන් පර්වතය කවරෙක්ද 32:3–4? (යේසුස් ක්‍රිස්තුස්වහන්සේ.) යේසුස් ක්‍රිස්තුස්වහන්සේව යම් අවස්ථාවලදී පර්වතය යනුවෙන් හැඳින්වීම ගැන ඔබ සිතන්නේ කුමක්ද? (බලන්න හීලමන් 5:12.) පර්වතය මත ගොඩනැගීම යනු කුමක්ද? (බලන්න ද්වීතීය කථාව 32:46–47; මතෙව් 7:24–27; ඩීසහඝී 50:44.)

අමතර කියවීම්ඃ ද්වීතීය කථාව 4; 7:1–4; 13:1–8; 34.

## “ශක්තිමත්ව ධෛර්‍යමත්ව සිටපන්න” 18

*යොෂුවා 1–6; 23–24*

පහත සඳහන් ශුද්ධ ලියවිලි අධ්‍යයනය කරන්න

අ. යොෂුවා 1. ස්වාමීන්වහන්සේ මෝසෙස්ගෙන් පසුව යොෂුවා කැඳවනසේක. ඉශ්‍රායෙල්ට ස්වාමීන්වහන්සේ පොරොන්දුවූ දේශය අයත්කරගැනීමට යොෂුවා ඔවුන්ව සූදානම්කරයි.

ආ. යොෂුවා 3–4; 6. ඉශ්‍රායෙල්වරු යෝර්දාන් ගංගාව වියලි පොළොව මත තරණයකර ඔවුන්ගේ ගමනේ ස්මාරයක් ලෙස ගල් 12ක් එහි පිහිටුවති. ඉශ්‍රායෙල්වරුන්ගේ ඇදහිල්ල තුලින් යෙරිකෝව විනාශවෙයි.

ඇ. යොෂුවා 23; 24:14–31. යොෂුවා සහ ඔහුගේ ජනතාව ස්වාමීන්වහන්සේට සේවයකිරීමට ගිවිසුම් කරති

ඉශ්‍රායෙල් මුළු පරම්පරාම දැන සිටි එකම නායකයා වූයේ මොසෙස්ය. නමුත් ඔවුන්ගේ වනාන්තරයේ ගමන අවසානයේදී—. ඔවුන් විශාල පරීක්ෂාවකට මුහුණදුන් විට ස්වාමීන්වහන්සේ ඔහුව ගත්සේක. උන්වහන්සේ ඉශ්‍රායෙල්ට දුන් පොරොන්දු සිහිකරමින්, ස්වාමීන්වහන්සේ අළුත් නායකයෙක්වූ, යොෂුවා එසවූසේක.

- "ශුභ සිද්ධිය ඇතිවීම" සඳහා ස්වාමීන්වහන්සේ යොෂුවාට කිරීමට කුමක් කීසේක්ද? (බලන්න යොෂුවා 1:8.) යොෂුවාට ඔහුගේ කැඳවීමේ සාර්ථකත්වය සඳහා ශුද්ධ ලියවිලි අධ්‍යයනය වැදගත්වීම ගැන ඔබ සිතන්නේ මොනවාද? ක්‍රමික ශුද්ධ ලියවිලි අධ්‍යයනය ඔබට උපකාරවත්වූයේ කෙසේද?
- යොෂුවා සිය ජීවිත අවසානයේදී දුන් වැදගත් උපදේශය කුමක්ද? (බලන්න යොෂුවා 24:14–15.) ස්වාමීන්වහන්සේට සේවයකිරීමට අදම තෝරාගැනීම වැදගත්වන්නේ මන්ද? අප උන්වහන්සේට සේවයකිරීම තෝරාගත්බව අප පෙන්වන්නේ කෙසේද?

අමතර ශුද්ධ ලියවිලිः යොෂුවා 7; 14.

---

## විනිශ්චයකරුවන්ගේ රාජ්‍ය පාලනය 19

***විනිශ්චයකාරයන්ගේ පොත 2; 4; 6–7; 13–16***

පහත සඳහන් ශුද්ධ ලියවිලි අධ්‍යයනය කරන්නः

අ. විනිශ්චයකාරයන්ගේ පොත 2:6–23. ඉශ්‍රායෙල්වරුන්ගේ පරම්පරා ස්වාමීන්වහන්සේ අමතක කොට බොරු දෙවිවරුන්ට සේවයකරති.

ආ. විනිශ්චයකාරයන්ගේ පොත 4:1–16. කනාන්හි රජුවූ යාබින්ගෙන්, ඉශ්‍රායෙල් නිදහස්කර ගැනීමට බාරාක්ට නියෝග කෙරෙයි (4:1–7). දෙබොරා ඔහුත් සමග එන්නේ නම් එහි යාමට ඔහු එකගවෙයි (4:8–9). දෙබොරා සහ බාරාක් කනානිවරුන්ගෙන් ඉශ්‍රායෙල් ගලවාගනිති (4:10–16).

ඇ. විනිශ්චයකාරයන්ගේ පොත 6–7. මිදියන්වරුන්ගෙන් ඉශ්‍රායෙල් ගලවාගැනීමට ගිඩියොන්ට නියෝග කෙරේ (6:1–24). ඔහු තවත් මිනිසුන් 10 දෙනෙක් සමග බාල්ගේ අල්තාරය විනාශකරයි (6:25–35). සළකුණු දෙකක් දීම මගින් උදව්කරන බවට ස්වාමීන්වහන්සේ ගිඩියොන්ට සහතික වනසේක (6:36–40). ගිඩියොන් හා තවත් මිනිස්සු 300ක් ඉශ්‍රායෙල් ගලවාගනිති (7:1–25).

ඈ. විනිශ්චයකාරයාගේ පොත 13–16. සම්සොන්ව නාශරියෙකු ලෙස හදාගන්නා ලෙස දේවදූතයෙක් සම්සොන්ගේ දෙමාපියන්ට උපදෙස් දෙයි (13:1–25). සම්සොන් ශක්තිමත් වීර ක්‍රියා කරන නමුත් නාශරියන්ගේ බොහෝ පොරොන්දු කඩකරයි (14–15). සම්සොන් දෙලීලාගේ පෙළඹවීම්වලට යටත්වෙයි; ඔහුගේ හිස කෙස් කපාදැමීමෙන්, ඔහු දුර්වල වෙයි, ඔහු පිලිස්තිවරුන්ට හසුවී, ඔවුන්ගේ දේවමාළිගාව කඩා දමන විට මිය යයි (16:1–31).

යොෂුවා මිය යාමෙන් පසුව, විනිශ්චයකරුවෝ ඉශ්‍රායෙල්ගේ පාලකයන් සහ හමුදා නායකයන් ලෙස සේවයකරති ඔවුන්ගේ රාජ්‍ය පාලනයේ බොහෝ දුක්මුසු සිද්ධීන් ඇතිවූ අතර, ඉශ්‍රායෙල්වරුන් කිහිප වතාවක් ඇදහිල්ලෙන් වැටීම, වහල්බවට පත්වීම, පසුතැවීම, සහ ගලවාගැනීම් බොහොමයක්ද ඇතිවිය. මෙම ඉතිහාසයේ දුක්මුසු කොටස් වෙනස්වූයේ දෙබොරා සහ ගිඩියොන් වැනි ධර්මිෂ්ඨ විනිශ්චයකරුවන්ගේ කථාවලිනි, ඔවුහු සත්‍යවාදීව සිටිමින්, ඔවුන්ගේ ජනතාව ගලවාගැනීම සඳහා ඔවුහු ඇදහිල්ල සහ නිර්භීතකම ක්‍රියාත්මක කළහ.

- සැබෑ මිතුරෙක්වීම ගැන දෙබොරාගෙන් අපට ඉගෙනගත හැක්කේ මොනවාද? අසීරු අභියෝගවලට මුහුණදීමට හෝ ස්වාමීන්වහන්සේගේ පණත්වලට කීකරුවීමට ඔබගේ මිතුරන් ඔබට උපකාරකර තිබෙන්නේ කෙසේද? අප අන් අයට හොඳ මිතුරන් වන්නේ කෙසේද?
- ඉශ්‍රයෙල් ගෘහයේ නාශරියෙකු සහ සාමාජිකයෙකු ලෙස, සම්සොන් ස්වාමීන්වහන්සේ හා ගිවිසුම් කළේය. ස්වාමීන්වහන්සේ හා

අපප තබන ගිවිසුම් මොනවාද? මෙම ගිවිසුම්වලින් ඔබ ශක්තිමත්වූයේ කෙසේද?

- සම්සොන් තම ගිවිසුම් කඩකිරීමේ විපාක වූයේ මොනවාද? (බලන්න විනිශ්චයකාරයාගේ පොත 16:17–21.) අප අපගේ ගිවිසුම් කඩ කරන විට ලැබෙන විපාක මොනවාද?

අමතර කියවීම: ——————

## "නුවර සියලු මනුෂ්‍යයෝ . . .නුඹ ගුණවත් ස්ත්‍රියක් බව දනිති" 20

*රූත්; 1 සාමුවෙල් 1*

පහත සඳහන් ශුද්ධ ලියවිලි අධ්‍යයනය කරන්න:

අ. රූත් 1–2. සිය ස්වාමිපුරුෂයා මියගිය පසු, රූත් තම නැන්දනියවූ, නයෝමි සමග බෙත්ලෙහෙමට යයි. බොහෙත්ලෙහෙමේදී, රූත් බෝවස්ගේ කෙත් වතුවල වැඩකරන අතර, ඔහු ඇයට කරුණාවෙන් සළකයි.

ආ. රූත් 3–4. රූත් බෝවස්ගේ පාමුල වැටෙන අතර, ඇය විවාහකර ගැනීමට ඔහු පොරොන්දුවෙයි. ඔවුහු විවාහවී, දරුවෙකු ලබති.

ඇ. 1 සාමුවෙල් 1; 2:1–2, 20–21. හන්නා දරුවෙකු සමග ආශිර්වාදිතවූ අතර, ඇයද පොරොන්දු ප්‍රකාර ඔහුව ස්වාමීන්වහන්සේට දෙයි. ඇය පසුව තවත් දරුවන් ලැබීමට ආශිර්වාදිත වූවාය.

- නයෝමි සමග බෙත්ලෙහෙමට යාමෙන් රූත් අත්හැරියේ මොනවාද? නයෝමි සමග යාමෙන් රූත් ලබාගත්තේ මොනවාද? (යේසුස් ක්‍රිස්තුස්වහන්සෙගේ සුභාරංචිය; බලන්න රූත් 1:16.) සුභාරංචිය වෙනුවෙන් පරිත්‍යාග කිරීම ගැන අපට රූත්ගෙන් ඉගෙනගත හැක්කේ මොනවාද?
- සාමුවෙල්ව ස්වාමීන්වහන්සේගේ සේවය සඳහා ලබාදීම ගැන හන්නාට ඇතිවූ හැඟීම් ගැන ඔබ සිතන්නේ කෙසේද? ස්වාමීන්වහන්සේට දෙන ලෙස උන්වහන්සේ අපගෙන් ඉල්ලන්නේ කුමක්ද? උන්වහන්සේට දීම ගැන අපගේ ආකල්පය විය යුත්තේ කුමක්ද?
- රූත්, නයෝමි, සහ හන්නා ආදර්ශයක්වූ ධර්මිෂ්ඨ ගුණාංග මොනවාද?

## දෙවියන්වහන්සේට ගරුකරන්නන්ට උන්වහන්සේ ගරුකරනසේක 21

***1 සාමුවෙල් 2–3; 8***

පහත සඳහන් ශුද්ධ ලියවිලි අධ්‍යයනය කරන්න:

අ. 1 සාමුවෙල් 2:12–17, 22–25. පව් කරන ඒලිගේ පුතුන්ට, ඔවුන්ගේ පියා විසින් උපදෙස් දෙනු ලබයි.

ආ. 1 සාමුවෙල් 2:27–36; 3:12–14. දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයෙක් ඒලිගේ පවුලේ දුෂ්ටකම්වල විපාක ගැන ඔහුට අනතුරු අඟවයි.

ඇ. 1 සාමුවෙල් 1 3. ස්වාමීන්වහන්සේ සාමුවෙල්ව කැඳවන අතර, සාමුවෙල් ප්‍රතිචාර දක්වයි.

ඈ. 1 සාමුවෙල් 8. ඉශ්‍රායෙල්වරුන්ට රජෙකු අවශ්‍ය වෙයි, එවිට ඔවුන්ද "සියලු ජාතීන් මෙන්" විය හැකිය. එවැනි තේරීමක ඇති භයානකකම ගැන සාමුවෙල් අනතුරු අඟවයි.

- ඒලිගේ පුතුන් ගරුකිරීමට තෝරාගත් පුද්ගලයා ගැන ඔවුන්ගේ ක්‍රියාවලින් යෝජනාවන්නේ කුමක්ද? (බලන්න 1 සාමුවෙල් 2:12–17, 22–25.) ස්වාමීන්වහන්සේ අමතක කර අප සමහර අවස්ථාවලදී ගරුකරමින්

අපව තෘප්තිමත්කරන අපගේ ජීවිතවල යම් අංශ මොනවාද?

- දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයෙක් ඒලි වෙත පැමිණ, ඒලි දෙවියන්වහන්සේට වඩා ඔහුගේ පුතුන්ට ගරුකරන බවට චෝදනා කළේය (1 සාමුවෙල් 2:27–29). ඒලි දෙවියන්-වහන්සේට වඩා ඔහුගේ පුතුන්ට ගරු කළේ කුමන ආකාරයෙන්ද? අප සමහර අවසථා-වලදී දෙවියන්වහන්සේට වඩා අන් අයට ගරුකරන්නේ කෙසේද?

- සාමූවෙල් ස්වාමීන්වහන්සේට ගරු කළේ කෙසේද? ස්වාමීන්වහන්සේ ඔහුට ගරු කළේ කෙසේද? (බලන්න 1 සාමුවෙල් 3:19; තවද බලන්න 1 සාමුවෙල් 2:30.) අප ස්වා-මීන්වහන්සේට ගරුකරන විට උන්වහන්-සේද අපට ගරුකරන බව ඔබ සිතන්නේ කෙසේද?

---

## “ස්වාමීන්වහන්සේ සිත බලනසේක” 22

***1 සාමුවෙල් 9–11; 13; 15–17***

පහත සඳහන් ශුද්ධ ලියවිලි අධ්‍යයනය කරන්නː

අ.. 1 සාමුවෙල් 9–11. සාවුල් සාමුවෙල්ගෙන් මගපෙන්වීම් සොයයි (9:1–14, 18–24). සාවුල් රජු විය යුතු බව ස්වාමීන්වහන්සේ සාමු-වෙල්ට එළිදරව්කරනසේක (9:15–17). සාමු-වෙල් සාවුල්ට උපදෙස්දී, ඉශ්‍රායෙල් පළමු රජු ලෙස ඔහුව ආලේප කරයි (9:25–27; 10:1–8). සාවුල් ආත්මිකව නැවත ඉපදී, අනාවැකි කියයි (10:9–13). සාමුවෙල් සාවුල්ව ජනතාවට ඉදිරිපත්කරයි (10:17–27). සටනකදී සාවුල් ඉශ්‍රායෙල්ව ජයග්‍රහනය කරා ගෙනයයි (11:1–11). ජනතාවට මගපෙන්වීමට ඔහුට නොහැකියයි සැක කල මිනිසුන්ට දඬුවම්කිරීම ඔහු ප්‍රතික්ෂේප කරයි (11:12–15).

ආ. 1 සාමුවෙල් 13:1–14. සාවුල් නිසි බලයක් නොමැතිව දවන පූජාවක් ඔප්පුකරයි

ඇ. 1 සාමුවෙල් 15. අමෙලෙක්වරුන් සහ ඔවුන් සතු සියල්ල විනාශකිරීමට සාමුවෙල්ට අණ කෙරෙන නමුත්, ඔවුන්ගේ සතුන් කිහිපදෙ-නෙක් පූජාකිරීම පිණිස ඉතිරිකර ගනියි (15:1–9). ස්වාමීන්වහන්සේ සාවුල් රජෙක් ලෙස ප්‍රතික්ෂේප කරනසේක, කීකරුකම පූජාකිරීමට වඩා හොඳ බව සාමුවෙල් සාවුල්ට කියයි (15:10–35).

ඈ. 1 සාමුවෙල් 16. සාවුල්ගේ ඇවෑමෙන් දා-වීත්ව රජු ලෙස ස්වාමීන්වහන්සේ තෝරා-ගන්නා සේක (16:1–13). ශුද්ධවූ ආත්මය සාවුළුගෙන් පිටව ගොස්, නපුරු ආත්මය ඔහුව අයත්කර ගනියි (16:14–16; නපුරු ආත්මය දෙවියන්වහන්සේගෙන් නොවන බව Joseph Smith Translation (ජෝසෆ් ස්මිත් පරිවර්තනයේ) මෙම පදවලින් පෙන්වන බව සලකන්න). සාවුල් තමාගේ වීණා වාද-කයා ලෙස සහ ආයුද ගෙනයන්නා ලෙස දාවිත්ව තොරාගනු ලබයි (16:17–23).

ඉ. 1 සාමුවෙල් 17. දාවිත් ස්වාමීන්වහන්සේගේ ශක්තිය තුලින් ගෝලියත් මරා දමයි.

- අමෙලෙක්වරුන්ගේ සතුන් ගලවාගැනීම ගැන සාවුල්ගේ ප්‍රකාශයට සාමුවෙල් ප්‍රති-චාර දැක්වූයේ කෙසේද? (බලන්න 1 සාමු-වෙල් 15:22.) සාමුවෙල්ගේ වචන අපට අදාළවන්නේ කෙසේද?

- සාවුල් වෙනුවට යෙස්සේගේ කුමන පුත්‍රයා රජවිය යුතුදැයි නිශ්වයකිරීමට සාමුවෙල් ගත් උත්සාහයේදී ඔහු දැනගත්තේ කුමක්ද? (බලන්න1 සාමුවෙල් 16:6–7.) ස්වාමීන්ව-හන්සේ අපගේ අගය විනිශ්චයකරන අන්දම ගැන 1 සාමුවෙල් 16:7 අපට උගන්වන්නේ මොනවාද? ස්වාමීන්වහන්සේ අපගේ හදවත් තුල සොයන්නේ මොනවාද? අන් අයගේ බාහිර පෙනීම අභිබවා හදවත දෙස බැලීමේ අපගේ හැකියාවන් සහ වගකීම් අප දියුණුකරගන්නේ කෙසේද?

- දාවිත්ට ගෝලයිත් හා සටන්කිරීමට ධෛර්‍ය්‍ය ලැබුනේ කෙසේද? (බලන්න 1 සාමුවෙල් 17:32–37, 45–47.) ඔබ මුහුණදුන් “ගෝලියත්ලා” ජයගැනීමට ස්වාමීන්වහන්සේ ඔබට උපකාරකර තිබෙන්නේ කෙසේද?

අමතර කියවීම්ː 1 සාමුවෙල් 12; 14.

## “ස්වාමීන්වහන්සේ සෑම කල්හිම නුඹත් මාත් අතර වනසේක” 23

*1 සාමුවෙල් 18–20; 23–24*

පහත සඳහන් ශුද්ධ ලියවිලි අධ්‍යයනය කරන්නඃ

අ. 1 සාමුවෙල් 18:1–16.යොනතාන් සහ දාවිත් මිත්‍රත්වයේ ගිවිසුමක් ඇතිකරගනිති (18:1–4). දාවිත් සටන සාර්ථකව කළ නිසා ඉශ්‍රායෙල්වරුන් විසින් ඔහුට ගෞරවකරනු ලබයි (18:5–7). සාවුල් දාවිත්ට ඊර්ෂ්‍යාකරමින් ඔහුව මැරීමට උත්සාහකරයි (18:8–16; සටහන, සාවුල් වෙත පැමිණි නපුරු ආත්මය දෙවියන්වහන්සේගෙන් නොවන බව Joseph Smith Translation (ජෝසෆ් ස්මිත් පරිවර්තනයේ) 10 වෙනි පදයෙන් පෙන්වයි).

ආ. 1 සාමුවෙල් 18:17–30; 19:1–18. දාවිත් සාවුල්ගේ දියණිය හා විවාහවීමේ අයිතිවාසිකම වෙනුවෙන් පිලිස්තිවරුන් හා සටන්කරන මුත්, සටන තුල දාවිත් මරණයට පත්වීමේ සාවුල්ගේ බලාපොරොත්තුව ගැන ඔහු නොදනියි (18:17–25). දාවිත් පිලිස්තිවරුන් ජයගෙන සාවුල්ගේ දියණිය මීබල් හා විවාහවෙයි (18:26–28). යොනාතාන් දාවිත්ට සැඟව සිටීමට කියා, ඔහුව නොමරන ලෙස සාවුල්ට ඒත්තුගැන්වීමට උත්සාහ කරයි (19:1–7). දාවිත්ව මැරීමේ තවත් උත්සාහයකින් සාවුල් අසමත්වෙයි (19:9–10). දාවිත්ගේ ජීවිතය ගැනීමට සාවුල් ගත් තවත් උත්සාහයකින් මීබල් ඔහුව ගලවාගනියි (19:11–18).

ඇ. 1 සාමුවෙල් 20. යොනාතාන් සහ දාවිත් ඔවුන්ගේ මිත්‍රත්වයේ සහ සමාදානයේ ගිවිසුම් අළුත්කරති. දාවිත්ව මැරීමට සාවුල් නැවතත් උත්සාහ කරන විට, යොනාතාන් දාවිත්ව අනතුරු අඟවයි.

ඈ. 1 සාමුවෙල් 23–24. දාවිත් පිලිස්තිවරුන් සමග දිගටම සටන්කරන අතර සාවුල් පළායයි. දාවිත් සාවුල්ව සොයාගෙන ඔහුගේ ජීවිතය බේරයි.

- යොනාතාන් දාවිත්ට ඊර්ෂ්‍යා නොවීම හෝ ඔහු විසින් තර්ජනය නොකිරීම ගැන ඔබ සිතන්නේ මන්ද? (1 සාමුවෙල් 18:1, 3.)
- දාවිත්ට විරුද්ධවීමට සාවුල් පෙළඹුනේ මන්ද? (බලන්න 1 සාමුවෙල් 18:6–9.) අන් අයගේ සාර්ථකත්වය ගැන සතුටුවීමට සමහර අවස්ථාවලදී අසීරුවන්නේ මන්ද? ඊර්ෂ්‍යාව සහ අහංකාරකම අපගේ ආත්මික යහපතට බලපාන්නේ කෙසේද?
- දෙවියන්වහන්සේ තුල ඇදහිල්ල යොනාතාන්ගේ හා දාවිත්ගේ මිත්‍රත්වයට බලපෑවේ කෙසේද? (බලන්න 1 සාමුවෙල් 20:23.) අප දෙවියන්වහන්සේට දක්වන ප්‍රේමය අප අන් අයට දක්වන ප්‍රේමයට බලපාන්නේ කෙසේද?
- පළිගැනීම ගැන දාවිත්ගේ අදර්ශයෙන් අපට ඉගෙනගත හැක්කේ කුමක්ද? (බලන්න 1 සාමුවෙල් 24:6–15.)

අමතර කියවීම්ඃ 1 සාමුවෙල් 14:1–16; 2 සාමුවෙල් 1.

## “පවිත්‍ර සිතක් මා තුළ මැවුව මැනව” 24

*2 සාමුවෙල් 11–12; ගීතිකා 51*

පහත සඳහන් ශුද්ධ ලියවලි අධ්‍යයනය කරන්න;

අ. 2 සාමුවෙල් 11. උරියාගේ භාර්යාවවූ බැත්ෂෙබා හා දාවිත් පරදාර සේවනයේ යෙදෙයි (11:1–5). දාවිත් සිය පාපය සැඟවීමේ උත්සාහයේදී අසමත්වෙයි (11:6–13). ඔහු උරියාගේ මරණය සැලසුම්කරයි (11:14–17). දාවිත් බැත්ෂෙබා විවාහකරගන්නා අතර, ඔවුන්ට පුතෙක් ලැබෙයි (11:26–27).

ආ. 2 සාමුවෙල් 12:1–23. නාතාන් අනාගතවක්තෘවරයා උපමා කථාවක් කීම මගින් දාවිත්ගේ පාපයේ භයානකකම ගැන උගන්වයි (12:1–6). දාවිත්ගේ පාපය නිසා ඔහුට දඬුවම් ලැබෙන බව ඔහුට කියයි (12:1–6). Joseph Smith Translation (ජෝසෆ් ස්මිත් පරිවර්තනයේ) 13 වෙනි පදයෙන් නාතාන් මෙසේ කියන බව සලකන්න, “නුඹ නොමැරෙන බවට ස්වාමීන්වහන්සේ නුඹේ

පාපය ඉවත නොදමනසේක"). දාවිත් සහ බැත්ෂෙබාගේ පළමු පුත්‍රයා ළදරු කාලයේම මියයයි (12:15–23).

ඇ. ගීතිකා 51. පසුතැවෙන්නෙක් වන දාවිත් කමාව සොයයි.

සාවුල්ගෙන් පසු රජවූ දාවිත් ඉශ්‍රායෙල් ඉතිහාසයේ ශ්‍රේෂ්ඨතම රජෙක් බවට පත්විය. ඔහු එක් ජාතියක් ලෙස ගෝත්‍ර එක්සත් කර, ඔහුගේ ජනතාවට පොරොන්දුවී තිබූ දේශයේ අයිතිය ආරක්ෂාකර, දේව නීතිය පදනම්වූ ආණ්ඩුවක් ඇති කළේය. කෙසේවුවද, ඔහුගේ පුද්ගලික ජීවිතයේ අවසන් වසර 20 ඔහුගේ පාපයේ විපාක මගින් පළුදුව තිබින.

- පරදාර සේවනයට යොමුවීමට දාවිත් කළේ කුමක්ද? (බලන්න 2 සාමුවෙල් 11:2–4.) ලිංගික පාප කිරීමට මිනිසුන් පෙළඹීමට යොමුවිය හැකි දේවල් මොනවාද? ලිංගික පාප කිරීම සඳහා පෙළඹවීම් වැළැක්වීමට අපට කළ හැකි දේවල් මෙනවාද?
- දාවිත් සිය දුරාචාරය සැඟවීමට තැත්කිරීමේදී ඔහු කළ වඩාත් බරපතල පාපය කුමක්ද? (බලන්න 2 සාමුවෙල් 11:14–17.) තම පාපය සැඟවීමට හැකි යයි දාවිත් සිතුවේ කවරෙක්ගෙන්දැයි ඔබ සිතන්නේද? වර්තමානයේදී මිනිසුන් පාප සැඟවීමට උත්සාහගන්නේ කෙසේද? අපගේ පාප සැඟවීමට අප උත්සාහකරන විට කුමක් සිදුවන්නේද?

අන් අයට පසුතැවීමට උපකාරකිරීමේ කැමැත්ත ගීතිකාවක් තුලින් දාවිත් ස්වාමීන්වහන්සේට මෙසේ කියයි, "මම අපරාධකාරයන්ට ඔබගේ මාර්ගය [උගන්වන්නෙමි]; පව්කාරයෝද ඔබ වෙත හරවනු ලබන්නෝය" (ගීතිකා 51:13). උරියාගේ මරණය සැලසුම් කළ නිසා දාවිත් සිය උත්කර්ශය අහිමිකර ගත්තද, දුරාචාරයේ පාපයට ඔහු කමාව සෙවීමෙන් ඔහුගේ පසුතැවීමේ ආකලපයෙන් අපට යමක් ඉගෙනගැනීමට හැකිය. ගීතිකා 51 සඳහන් ඔහුගේ වචනවලින් සැබෑ පසුතැවිල්ලේ බොහෝ අංශයන් ඉගැන්වෙයි. ඔබ ගීතිකා අධ්‍යයනයකරන විට, දාවිත්ගේ පසුතැවීමේ ආදර්ශය ඔබගේ ජීවිතයට අදාළකරගත හැකි මාර්ග සොයන්න.

අමතර කියවීම්: 2 සාමුවෙල් 2–10.

---

## "හුස්ම ඇති සියල්ලෝම ස්වාමීන්වහන්සේට ප්‍රශංසාකරව්" 25

***ගීතිකා***

මෙහි සාකච්ඡාවන ශුද්ධ ලියවිලි සහ ගීතිකා පොතේ ඔබට හැකි පමණ ගීතිකා අධ්‍යයනය කරන්න.

ගීතිකා පොත දෙවියන්වහන්සේට ප්‍රශංසා හෝ ආයාචනා ලෙස මුල් කාලයේදී ගායනාකළ කවි එකතුවකි. බොහෝ ඒවා දාවිත් විසින් ලියන ලදී. මෙම පොත පැරණි ඉශ්‍රායෙලයේ ස්තෝත්‍ර සංග්‍රහයක් වැනිය.

මෙසියස්වහන්සේ ලෙස ක්‍රිස්තුස්වහන්සේගේ දූතමෙහෙය ගැන ගීතිකා බොහොමයකින් අනාවැකි කියයි. ක්‍රිස්තුස්වහන්සේ ගැන ගීතිකා පොතේ ලියා තිබෙන පහත සඳහන් අනාවැකි සම්පූර්ණවීම ගැන බලන්න:

| අනාවැකිය | සම්පූර්ණවීම |
| --- | --- |
| ගීතිකා 69:20 | මාර්ක් 14:32–41 |
| ගීතිකා 22:7–8 | මතෙව් 27:39–43 |
| ගීතිකා 22:16 | මාර්ක් 15:25 |
| ගීතිකා 22:18 | මතෙව් 27:35 |
| ගීතිකා 22:1 | මතෙව් 27:46 |
| ගීතිකා 27:46 | ක්‍රියා 2:31–32; 13:34–35 |

ගැලවුම්කරුවාණන්ගේ දයාව, කමාවදීම, සහ ප්‍රේමය වෙනුවෙන් උන්වහන්සේට කෘතඥතාවය පළකරන පහත සඳහන් ගීතිකා කියවන්න: 23; 51; 59:16; 78:38; 86:5, 13; 100:4–5; 103:2–4, 8–11, 17–18.

ස්වාමීන්වහන්සේ තුල විශවාසය තැබීමේ වැදගත්කම උගන්වන පහත සඳහන් ගීතිකා කියවන්න: ගීතිකා 4:5; 5:11; 9:10; 18:2; 56:11; 62:8; 118:8–9.

දේවමාළිගාව ගැන පහත සඳහන් ගීතිකා කියවන්න: ගීතිකා 5:7; 15:1–3; 24; 27:4; 65:4; 84:1–2, 4, 10–12; 122; 134.

# සාලමොන් රජතුමා ප්‍රඥාවේ මිනිසා, අඥාන මිනිසා 26

***1 රාජාවලිය 3; 5–11***

පහත සඳහන් ශුද්ධ ලියවිලි අධ්‍යයනය කරන්නඃ

අ. 1 රාජාවලිය 3:5–28. සාලමොන් තම පියාවූ, දාවිත් රජුගෙන් පසුව රජවී, ස්වාමීන්වහන්සේ අනුගමනය කරයි. ස්වාමීන්වහන්සේ සාලමොන්ට ප්‍රකාශවී, ප්‍රඥාවෙන්, වස්තුවෙන් සහ ගෞරවය සමග ඔහු ආශිර්වාද කළසේක (3:5–15). ස්ත්‍රීහු දෙදෙනෙක් සාලමොන් වෙත දරුවෙකු ගෙන යති, දරුවාගේ මව කවුදැයි ඔහු ඥානවන්ත ලෙස විනිශ්චයකරයි (3:16–28).

ආ. 1 රාජාවලිය 5–6; 7:1–12.සාලමොන් රජතුමා මහත්වූ දේවමාළිගාවක් සෑදීම මෙහෙයවයි (5–6). ඔහු වෙනුවෙන් සාදන ලද මාළිගයක් ඔහුට ඇත (7:1–12).

ඇ. 1 රාජාවලිය 8:22–66; 9:1–9. සාලමොන් දේවමාළිගාව කැප කරමින්, ඊශ්‍රායෙල්ව ආත්මික සහ ලෞකිකව ආශිර්වාදකර සමෘද්ධිමත්කරන ලෙස ස්වාමීන්වහන්සේගෙන් ඉල්ලයි (8:22–66). ස්වාමීන්වහන්සේ නැවතත් සාලමොන්ට ප්‍රකාශවී, ඉශ්‍රයෙල්වරුන් උන්වහන්සේට සේවයකරන්නේ නම්, ඔවුන්ට ආශිර්වාද කරන බවටද, නමුත් ඔවුන් වෙනත් දෙවිවරුන් වෙත හැරෙන්නේ නම් ඔවුන්ට ශාපකරන බවටද, පොරොන්දුවනසේක (9:1–9).

ඈ 1 රාජාවලිය 10–11. සාලමොන්ගේ වස්තුව සහ ප්‍රඥාව නිසා ඔහුගේ ප්‍රසිද්ධිය වැඩිවෙයි (10:1–13, 24–25). ඔහු අධික වස්තුකරුවෙකු බවට පත්වෙයි (10:14–23, 26). ඔහු බොහෝ අන්‍ය ජාතී ස්ත්‍රීන් සරණපාවගන්නා අතර, ඔවුහු බොරු දෙවිවරුන්ට නමස්කාර කිරීමට ඔහුව කැමතිකර ගනිති. (11:1–10). ස්වාමීන්වහන්සේ සාලමොන්ට විරුද්ධව සතුරන් කළඹවනසේක (11:11–25). සාලමොන්ගේ දුෂ්ටකම් නිසා ඉශ්‍රායෙල් රාජධානිය බෙදී වෙන්වන බව අනාගතවක්තෘවරයෙක් අනාවැකි කියයි (11:26–40).

- “නුවණැති සිතක්” තිබීම යන්නෙහි අදහස කුමක්ද? (බලන්න 1 රාජාවලිය 3:28; 4:29.) එම ආශිර්වාදය සඳහා විශේෂ වුවමනාවක් සාලමොන්ට ඇතිවුනේ මන්ද? (බලන්න 1 රාජාවලිය 3:7–8.) “දෙවියන්වහන්සේගේ ප්‍රඥාව” ලැබීමෙන් අපගේ නිවාස තුල වැඩබිමේ, පාසලේ, සහ සභාව තුල අපගේ වගකීම්වලට එය උපකාරවත්වන්නේ කෙසේද? අප මෙම ප්‍රඥාව ලබාගන්නේ කෙසේද?
- දේවමාළිගාව ගැන ස්වාමීන්වහන්සේ සාලමොන්ට දුන් පොරොන්දුව කුමක්ද? (බලන්න 1 රාජාවලිය 6:11–13.) වර්තමානයේදී ස්වාමීන්වහන්සේ අපට ලබාදී තිබෙන ඒ හා සමාන පොරොන්දුව කුමක්ද? (බලන්න ඩීසහගී 97:15–17.) දේවමාළිගාවේ ආනුභාවය අපගේ ජීවිතවල ශක්තිමත්ව තබාගැනීමට අපට කළ හැකි දේවල් මොනවාද?
- දේවමාළිගාව සෑදීමෙන් පසුව සාලමොන්ගේ වස්තුව සහ ගෞරවය වැඩිවුනේ කෙසේද? (බලන්න 1 රාජාවලිය 10:1–15, 24–25.) මෙම ආශිර්වාද සාලමොන් වැරදි ලෙස පාවිච්චි කළේ කෙසේද? (බලන්න 1 රාජාවලිය 10:16–23, 26–29.) ප්‍රඥාව, වස්තුව, සහ ගෞරවය පාවිච්චිකළ යුත්තේ කෙසේද? (බලන්න ජාකොබ් 2:18–19.)

අමතර කියවීම්; 1 රාජාවලිය 2:1–12; 4:29–34; 7:13–51; 1 ලේකම් 29; දහම සහ ගිවිසුම 46.

## දුෂ්ට සහ ධර්මිෂ්ඨ නායකයන්ගේ බලපැවැත්ම 27

***1 රාජාවලිය 12–14; 2 ලේකම් 17; 20***

පහත සඳහන් ශුද්ධ ලියවිලි අධ්‍යයනය කරන්නː

අ. 1 රාජාවලිය 12:1–20. රෙහොබොවම් ඔහුගේ පියාවූ සාලමොන්ගෙන් පසුව, ඉශ්‍රායෙල් ගෝත්‍ර දෙළොසේ රජුවෙයි. ඔහු ජනතාවට සේවය කිරීම සඳහා ප්‍රඥාවන්තයන්ගේ උපදෙස් ප්‍රතික්ෂේප කර, ඒ වෙනුවට ඔවුන් මත අධික බර පැටවීම සොයයි. (12:1–15). ගෝත්‍ර දහයක් විරෝධය දක්වන විට රාජධානිය බෙදී වෙන්වෙයි (12:16–19; ගෝත්‍ර දහය ඉශ්‍රායෙල් නාමය තබාගන්නා අතර, යුදා සහ බෙන්යමින් ගෝත්‍ර රෙහොබොවම් පාලනය යටතට පත්ව යුදා රාජධානිය ලෙස හඳුන්වනු ලබයි). ඉශ්‍රායෙල් රාජධානිය යෙරොබොවම් රජු ලෙස තෝරාගනියි (12:20).

ආ. 1 රාජාවලිය 12:25–33; 13:33–34; 14:14–16, 21–24. යෙරොබොවම් සිය ජනතාව රූප වන්දනාවට යොමුකරයි (12:25–33; 13:33–34). යෙරොබොවම්ගේ පවුලේ සහ ඉශ්‍රයෙල්ගේ විසිරයෑම ගැන අනාගතවක්තෘවරයෙක් අනාවැකි කියයි (14:14–16). රෙහොබොවම් යුදා රාජධානිය රූප වන්දනාවට යොමුකරයි (14:21–24).

ඇ. 2 ලේකම් 17:1–10; 20:1–30. රෙහෙබොවම්ගේ මී මුණුපුරාවන, යෙහෝෂාපාට්, යුදා රාජධානිය ධර්මිෂ්ඨව පාලනයකරයි (17:1–10). යුදා සතුරෝ ඔවුන්ට විරුද්ධව එන විට, යෙහෝෂාපාට් සහ ඔහුගේ ජනතාව උපවාසකර යාච්ඤාකරති. සටන ඔවුන්ගේ නොව තමන්වහන්සේගේ බව ස්වාමීන්වහන්සේ ඔවුන්ට කියනසේක. ඔවුන්ට පහරදෙන්නෝ ඔවුනොවුන් සමග යුද්ධකරගෙන එකිනෙකා විනාශ කරගනිති (20:1–30).

- සාර්ථක පාලනය ගැන රෙහෙබොවාන්ට වැඩිමහල්ලන් දුන් උපදෙස් මොනවාද? (බලන්න 1 රාජාවලිය 12:6–7; 2 ලේකම් 10:7.) මෙම උපදෙස් අප අපගේ නිවාසවල, වැඩ බිමේ, පාසලේ සහ සභාව තුල අදාළකර ගන්නේ කෙසේද?
- යුදා ජනතාවට ස්වාමීන්වහන්සේ ඉදිරියේ යටහත්වීමට යෙහෝෂාපාට් ජනතාවට කියයි (2 ලේකම් 20:3–4). ධර්මිෂ්ඨ නායකත්වයේ ඔබ දැක තිබෙන ධර්මිෂ්ඨ ආදර්ශ මොනවාද? අප සේවයකරන අයට ධර්මිෂ්ඨව ජීවත්වීමට පෙළඹවීමට අපට කළ හැකි දේවල් මොනවාද?

අමතර කියවීම්ː 1 රාජාවලිය 11:26–40; 2 රාජාවලිය 17:20–23.

## ‘ගින්නට පසු සියුම් නිශ්චලතාවේ හඬක් විය” 28

***1 රාජාවලිය 17–19***

පහත සඳහන් ශුද්ධ ලියවිලි අධ්‍යයනය කරන්නː

අ. 1 රාජාවලිය 17. එලියා අහසින් එන වැස්ස නවත්වයි, ඔහු ආහබ් සහ යෙසෙබෙල් වෙතින් පලාගොස් ආශ්චර්‍යමත් ලෙස වනාන්තරයේ ජීවත්වෙයි (17:1–6). ස්වාමීන් වහන්සේ එලියාව වැන්දඹුවක් වෙත යවන අතර, ඇය ඔහුට ආහාර සහ ජලය ලබාෙදයි (17:7–16). එලියා වැන්දඹුවගේ පුත්‍රයා මරණයෙන් නැගිටුවයි (17:17–24).

ආ. 1 රාජාවලිය 18. වසර දෙකකට වඩා පැවති සාගතයෙන් පසුව, එලියා ආහබ් හමුවී, අහසින් ගින්දර ගෙන්වාගෙන ඔවුන්ගේ පූජාව දවා පෙන්වන ලෙස බාල් පූජකයන්ට අභියෝග කරයි (18:1–2, 17–24). බාල් පූජකවරුන්ට නොහැකිවන නමුත්, එලියා යාච්ඤා කරයි, ස්වාමීන්වහන්සේ ඔහු පිළියෙල කළ පූජාව දවාලීමට පහළට ගිනි එවනසේක (18:25–40). සාගතය අවසන්වීමට එලියා යාච්ඤාකරන අතර, ස්වාමීන්වහන්සේ වැස්ස එවනසේක (18:41–46).

ඇ. 1 රාජාවලිය 19. එලියා මරාදැමීමට යෙසෙබල් උත්සාහ කරයි (19:1–2). එලියා වනාන්තරයට පලායයි, දේවදූතයෙක් ඔහුට ආහාර දෙයි (19:3–8). එලියා හොරෙබ් වෙත

යයි, එහිදී ශුද්ධාත්මයාණන් වහන්සේ ඔහු සනසා, දෙවියන්වහන්සේගේ වැඩවල නොකඩවා යෙදෙන ලෙස උපදෙස් දෙයි (19:9–19).

යෙරොබෝවාම් ඉශ්‍රායෙල්වරුන්ව රූප වන්දනාවට යොමුකිරීමෙන් පසුව, ඔහු සහ ඔහුගෙන් පැවතෙන්නන් විනාශ කරන ලදී. ඔවුන්ගෙන් පසුව තවත් රූප වන්දනා කරන රජවරු ඇති විය. එම පාලකයන්ගෙන් අහබ් රජු "තමාට පළමු සිටි සියලු ඉශ්‍රායෙල් රජුන්ටත් වඩා ඉශ්‍රායෙල් දෙවිවූ ස්වාමීන්වහන්සේ කෝපකිරීමට කාරණා කළේය." (1 රාජාවලිය 16:33). ඔහු යෙසෙබල් හා විවාහවී, ඇයගේ පුරුද්දවූ බාල් නමස්කාරය කරමින්, මෙම බොරු දෙවිවරුන් නමස්කාර කිරීමට ඔහු හා එක්වන ලෙස ජනතාව දිරිගැන්වීය. අනාගතවක්තෘ එලියා අහාබ්ට සහ ඔහුගේ රාජධානියට අනතුරු ඇඟවීමේ වචන දන්වා යැවීය.

- දුප්පත් වැන්දඹුව සහ ඇයගේ පුත්‍රයා ආහාර ගැනීමට පෙර එලියාට ආහාර දීමට ස්වාමීන්වහන්සේ ඇයට අණ කිරීම ගැන ඔබ සිතන්නේ කුමක්ද? (බලන්න 1 රාජාවලිය17:14–16.) අපගේ ජීවිතවලදී දෙවියන්වහන්සේට ප්‍රමුඛස්ථානය දීමට අපට කියන්නේ කුමන ආකාරයෙන්ද?
- එලියාගේ කථාව ඇසීමට ජනතාව කර්මේල් කන්දට එක්වූ විට, ඔහු මෙසේ ඇසීය, "නුඹලා කොපමණ කල් කල්පනා දෙකක් අතරේ හිරවී සිටිනවාද?" (1 රාජාවලිය 18:21). අප සමහර අවස්ථාවලදී කල්පනා දෙකක් අතරේ හිරවී සිටින්නේ කෙසේද?
- හොරෙබ් කන්දේදී දෙවියන්වහන්සේ එලියාව සැනසුවේ කෙසේද? (බලන්න 1 රාජාවලිය 19:9–13.) දෙවියන්වහන්සේ අප සමග කථාකරන අන්දම ගැන මෙමගින් අපට ඉගෙනගත හැක්කේ කුමක්ද? දෙවියන්වහන්සේ බොහෝ අවස්ථාවලදී ශබ්දනගා බලවත් ලෙස හැඟීම් ප්‍රකාශකරනු වෙනුවට ශුද්ධාත්මායාණන් තුලින් "කුඩා නිශ්චල හඬකින්" කථාකිරීම ගැන ඔබ කුමක් සිතන්නේද? ශුද්ධාත්මයාණන්ගේ සිහින් හඬ අප අවබෝධකරගන්නේ කෙසේද?

---

## "ඔහු එලියාගේ සළුව. . . අර ගත්තේය" 29

***2 රාජාවලිය 2; 5–6***

පහත සඳහන් ශුද්ධ ලියවිලි අධ්‍යනය කරන්නඃ

අ. 2 රාජාවලිය 2:1–18. අළුත් අනාගතවක්තෘවරයා ලෙස එලියා එලිෂාව සූදානම්කරයි (2:1–10). එලියාව ස්වර්ගයට ගෙන යනු ලබයි. එලිෂා එලියාගේ සළුව ගෙන අනාගතවක්තෘවරයා බවට පත්වෙයි (2:11–15). මිනිසුන් පනස් දෙනෙක් එලිෂාගේ උපදෙස් නොතකමින් එලියා සොයති (2:16–18).

ආ. 2 රාජාවලිය 5. එලිෂා නාමාන්ගේ කුෂ්ඨය සුවපත්කරයි (5:1–14). නාමාන් දෙවියන්වහන්සේට ප්‍රශංසාකරමින්, එලිෂාට තෑගි දෙයි, එලිෂා එය ප්‍රතික්ෂේප කරයි (5:15–19).

ඇ. 2 රාජාවලිය 6:8–18. සිරියාව සමග යුද්ධයේදී ඉශ්‍රායෙල් රජතුමාට එලිෂා උපදෙස් දෙයි (6:8–10). එලිෂාව අල්ලාගැනීමට සිරියාවේ රජතුමා නියෝගකරන අතර, හමුදාව දෝතාන් නුවර වටකරයි (6:11–14). එලිෂා බියට පත් නොවී, යාච්ඤාකරයි, එවිට ස්වාමීන්වහන්සේ ගිනි අශ්වයන්ගෙන්ද, ගිනි රථ වලින්ද කන්ද පුරවා, පසුව සිරියාවේ හමුදාව අන්ධකර පහරදෙනසේක (6:15–18).

- අනාගතවක්තෘවරයාගේ උපදෙස්වලට අප නොකැමැතිවුවද, ඒවා අපට නොතේරුනද, නැතහොත් එය කුඩා හෝ සරළ කාරණයක් වුවද— ඒවා පිළිපැදීම ගැන මෙම කථාවෙන් අපට උගන්වන්නේ කුමක්ද? අනාගතවක්තෘවරයා හෝ වෙනත් සභා නායකයන් විසින් අපට කිරීමට කියා තිබෙන කුඩා හෝ සරළ දේවල් මොනවාද? මේ දේවල් සමහර අවස්ථාවලදී කිරීමට අසීරු මන්ද? සභා නායකයන්ගේ උපදෙස් පිළිපැදීම සඳහා අපගේ කැමැත්ත අප වැඩිකරගන්නේ කෙසේද?
- එලිෂා සිය සේවකයන් අමතා, "ඔවුන් සමග සිටින්නන්ට වඩා අප සමග සිටින්නෝ බොහෝය" යයි කීමෙන් ඔහු අදහස් කළේ කුමක්ද"? (2 රාජාවලිය 6:16). එලිෂාගේ මෙම ප්‍රකාශය අදටත් සැබෑ බව ඔබ දැක තිබෙන්නේ කෙසේද?

## “ස්වාමීන්වහන්සේගේ ගෘහයට එන්න” 30

*2 ලේකම් 29–30; 32; 34*

පහත සඳහන් ශුද්ධ ලියවිලි අධ්‍යයනය කරන්න:

අ. 2 ලේකම් 29–30. යුදයේ රජු, හෙසකියා, දේවමාළිගාවේ දොරවල් විවෘතකර නමස්කාරය සඳහා එය පිරිසිදුකර පවිත්‍රකරන ලෙස පූජකයන් සහ ලෙවියන්ට උපදෙස් දෙයි (29:1–19). දේවමාළිගාව පිරිසිදු කළ පසු, හෙසකියා සහ ඔහුගේ ජනතාව එක්ව යාච්ඤාකර ස්වාමීන්වහන්සේට ප්‍රශංසා කරති (29:20–36). යෙරුසලමේ දේවමාළිගාවට එන ලෙස හෙසකියා සියලුම ඉශ්‍රායෙල්වරුන්ට ආරාධනාකරයි (30:1–9).සමහරු ආරාධනාව ගැන සිහනසෙන නමුත්, ඇදහිලිමත් ඉශ්‍රායෙල්වරු යෙරුසලමේදී ස්වාමීන්වහන්සේට නමස්කාර කරති (30:10–27).

ආ. 2 ලේකම් 32:1–23. අසිරියේ රජු, සෙනකෙරිබ්, යුදා ආක්‍රමනයකර ස්වාමීන්වහන්සේට විරුද්ධව කථාකරයි (32:1–19). යෙසායා සහ හෙසකියා උපකාර ඉල්ලා යාච්ඤාකරති. ස්වාමීන්වහන්සේගේ දේවදූතයෙක් අසිරියා හමුදාවෙන් බොහෝ දෙනෙක් විනාශකරයි (32:20–23).

ඇ. 2 ලේකම් 34. හෙසකියාගේ පුතා සහ මුනුබුරාගේ දුෂ්ට පාලනයෙන් පසුව, හෙසකියාගේ මී-මුනුබුරාවූ යොෂියා යුදයේ රජබවට පත්වෙයි. යොෂියා රාජධානියේ පිළිම විනාශකර දේවමාළිගාව අළුත්වැඩියා කරයි (34:1–13). නීති පොත දේවමාළිගාව තුලදී සම්භවී යොෂියාට කියවන අතර, ජනතාව නීතියෙන් කෙතරම් දුරට ඈත්ව තිබේදැයි දැනගෙන හඬාවැටෙයි (34:14–21). හුල්දා අනාගතවක්තෘවරිය යුදාවේ පාළුවීම ගැන කියන නමුත්, යොෂියා එය නොදකින බවට අනාවැකි කියයි (34:22–28). යොෂියා සහ ඔහුගේ ජනතාව ස්වාමීන්වහන්සේට සේවයකිරීමට ගිවිසුම් කරති (34:29–33).

- අපගේම උත්සාහයන් කෙරෙහි විශ්වාසකිරීම සහ ස්වාමීන්වහන්සේ කෙරෙහි විශ්වාසකිරීම අතර තිබෙන නිසි සම්බන්ධතාවය ගැන අපට ඉගෙනගත හැක්කේ මොනවාද? (බලන්න 2 ලේකම් 32:7–8.)
- යොෂියා සහ ඔහුගේ ජනතාව දේවමාළිගාව තුලදී, කුමක් කිරීමට ගිවිසුම් කෙළේද? (බලන්න 2 ලේකම් 34:31–33.) පූජනීය දේවමාළිගා ගිවිසුම් තැබීමට අපට සූදානම්විය හැක්කේ කෙසේද? අප මෙම ගිවිසුම් තැබූ විට, හැකි සෑම අවස්ථාවකදීම අප නැවත නිතරම මෙන් දේවමාළිගාවට යාම වැදගත්වන්නේ මන්ද?

අමතර කියවීම්: 2 රාජාවලිය 18–19; 22–23; යෙසායා 37:10–20, 33–38.

## “ඥානය ලබාගන්නා මනුෂ්‍යයා වාසනාවන්තයාය” 31

*හිතෝපදේශ සහ දේශනාකාරයා*

මෙහි සාකච්ඡාවන ශුද්ධ ලියවිලි සහ හිතෝපදේශ සහ දේශනාකාරයාගේ පොත්වල එන ශුද්ධ ලියවිලි ඔබට හැකි පමණ අධ්‍යයනය කරන්න.

හිතෝපදේශ යනු සාමාන්‍යයෙන් ධර්මිෂ්ඨව ජීවත්වීම ගැන උපදෙස් දෙන කෙටි ප්‍රකාශනවේ. සාලමොන් “හිතෝපදේශ තුන් දහසක් කියූ” බව පරණ ගිවිසුමේ වාර්තාවී ඇත (1 රාජාවලිය 4:32). මෙම ඥාවන්ත ප්‍රකාශ කිහිපයක් හිතෝපදේශ පොතේ ඇතුලත්ව ඇත. සාලමොන් සහ මෙම පොතේ අනෙක් කතුවරු අනාගතවක්තෘවරුන් නොවුනද, ඔවුන් ලියූ බොහොමයකට ස්වාමීන්වහන්සේ විසින් ආනුභාවය ලබාදී ඇත. දේශනාකාරයාගේ පොතේද ඥානවන්ත ප්‍රකාශ ඇතුලත් අතර, සමහරුන්ගේ විශ්වාසය එහි කතුවරයා සාලමොන් වන බවය.

- හිතෝපදේශ සහ දේශනාකාරයා යන පොත්, ඥානයේ ඇති වැදගත්කම ගැන අවධාරණය කරයි. උගත්කම සහ ඥානවන්තවීම අතර ඇති වෙනස කුමක්ද?

(බලන්න හිතෝපදේශ1:7; 9:9–10; 2 නිෆායි 9:28–29.)

- හිතෝපදේශ 3:5–7 ලබාදෙන උපදෙස් මොනවාද? ස්වාමීන්වහන්සේ විශ්වාසකිරීමට ඔබ ඉගෙනගෙන තිබෙන අත්දැකීම් මොනවාද?

- ඔබ කථාකරන වචන ගැන ස්වාමීන්වහන්සේ සැලකිලිමත් මන්ද? (බලන්න හිතෝපදේශ 16:27–28; 18:8; 25:18; මතෙව් 12:36–37.) බොරුකීම, ඕපාදූපකීම, හෝ අන් අය ගැන අසුභවාදීව කථාකිරීම යන ප්‍රශ්න අප මැඩපවත්වාගන්නේ කෙසේද?

- හිතෝපදේශ 13:10 සහ 16:18 උගන්වන පරිදි අහංකාරකම වාදයට සහ විනාශයට මුල්වේ. අහංකාරකමට මෙය කළ හැක්කේ කෙසේද? අහංකාරකම අපගේ පවුල්වලට බලපාන්නේ කෙසේද?

- හිතෝපදේශ 22:6 "දරුවෙකු සුදුසු මාර්ගයෙහි පුහුණුකරපන්න" යයි කියයි. මෙම උපදේශය අනුගමනයකිරීමට දෙමාපියන් කුමක් කළ යුතුද? (බලන්න ඩීසහසී 68:25–28.) දෙමාපියන්ට තම දරුවන්ට සුභාරංචි මූලධර්ම වඩාත් සාර්ථක ලෙස ඉගැන්වීමට හැකිවන්නේ කෙසේද?

- ප්‍රීතිමත් ආකල්පයක් සහ යහපත් සංතුෂ්ටිමත් සිතක් දියුණුකර ගන්නේ කෙසේද? (බලන්න හිතෝපදේශ 15:13; 17:22.) අපගේ පවුල් තුල සංතුෂ්ටිය නගාසිටුවීම දිරිගන්වන්නේ කෙසේද?

---

## "මාගේ මිදුම්කරුවාණන් ජීවත්ව සිටින බව මම දනිමි" 32

***යෝබ් 1–2; 13; 19; 27; 42***

පහත සඳහන් ශුද්ධ ලියවිලි අධ්‍යයනය කරන්නඃ

අ. යෝබ් 1–2. යෝබ්ට දරුණු පරීක්ෂාවන් අත්දැකීමට සිදුවෙයි. ඔහු සිය වස්තුව, දරුවන්, සහ ශරීර සෞඛ්‍යය නැතිවීම නොතකාහැර ස්වාමීන්වහන්සේට ඇදහිලිමත්වෙයි.

ආ. යෝබ් 13:13–16; 19:23–27. ස්වාමීන්වහන්සේ කෙරෙහි විශ්වාසය තැබීමෙන් සහ ගැලවුම්කරුවාණන් ගැන ඔහුගේ සාක්ෂිය තුලින් යෝබ් ශක්තිමත්වෙයි.

ඇ. යෝබ් 27:2–6. යෝබ් සිය පුද්ගලික ධර්මිෂ්ඨකම සහ අවංකත්වය තුලින් ශක්තිය ලබයි.

ඈ. යෝබ් 42:10–17. යෝබ් සිය පරීක්ෂාවන් ඇදහිල්ලෙන් දරාසිටීමෙන් පසුව, ස්වාමීන්වහන්සේ ඔහුට ආශිර්වාද කරනසේක.

- යෝබ් කුමන අන්දමේ මනුෂ්‍යයෙක්ද? යෝබ් අත්විඳි පරීක්ෂාවන් මොනවාද?

- යෝබ්ට පරීක්ෂාවන් දරාසිටීමට ගැලවුම්කරුවාණන් ගැන සාක්ෂිය ඔහුට උපකාර කළේ කෙසේද? (බලන්න යෝබ් 19:25–27.) ගැලවුම්කරුවාණන් ගැන සාක්ෂියකින් විපත් කාලවලදී අපට ශක්තිය ලබාගත හැක්කේ කෙසේද?

- යෝබ්ගේ අවංකත්වය ඔහුගේ පීඩාවේදී ඔහු ආත්මික ශක්තිය ලැබූ තවත් මාර්ගයකි (යෝබ් 27:2–6). අවංකත්වය යනු කුමක්ද? පුද්ගලික අවංකත්වය යෝබ්ට ඔහුගේ පරීක්ෂන කාලය තුලදී ශක්තියක් වූනේ කෙසේද? අපගේ පුද්ගලික අවංකත්වය පරීක්ෂන කාලවලදී අපට උපකාරවත් වන්නේ කෙසේද?

- යෝබ් ඇදහිලිමත්ව තම පරීක්ෂාවන් දරාසිටීමෙන් පසුව, ස්වාමීන්වහන්සේ ඔහුට ආශිර්වාද කළේ කෙසේද? (බලන්න යෝබ් 42:10–15; යාකොබ් 5:11.) අප ඇදහිලිමත්ව පරීක්ෂාවන් දරාසිටින විට ස්වාමීන්වහන්සේ අපට ආශිර්වාද කරන්නේ කෙසේද? (බලන්න යෝබ් 23:10; 3 නිෆායි 15:9.)

අමතර කියවීම්ඃ යෝබ් පොතේ අනෙක් පරිච්ඡේද; දහම සහ ගිවිසුම 121:1–10.

## ලෝකයා සමග සුභාරංචිය බෙදාගැනීම 33

***යෝනා 1–4; මීකා 2; 4–7***

පහත සඳහන් ශුද්ධ ලියවිලි අධ්‍යයනය කරන්නඃ

අ. යෝනා 1–2. නිනීවයේ ජනතාවට පසුතැවීම දේශනාකිරීමට ස්වාමීන්වහන්සේ යෝනා කැඳවනසේක. නැවක් තුලදී යෝනා ස්වාමීන්වහන්සේගෙන් පලායාමට උත්සාහ කරයි, ඔහුව විශාල මතස්‍යයෙක් ගිලියි, ඔහු යාච්ඤාකරයි, මතස්‍යයාගේ බඩින් ඔහු නිදහස්වෙයි.

ආ. යෝනා 3–4. නිනීවය හෙළාදමන බවට යෝනා අනාවැකි කියයි, නිනීවයේ ජනතාව පසුතැවීමෙන්, ස්වාමීන්වහන්සේ නුවර ඉතිරිකරන විට යෝනා අමනාපවෙයි (Joseph Smith Translation (ජෝසෆ් ස්මිත් පරිවර්තනය) යෝනා 3:9–10 පැහැදිළි කරන්නේ පසුතැවුනේ ජනතාව මිස, දෙවියන්වහන්සේ, නොවන බවය). සියලුම ජනතාවට ප්‍රේමකිරීමට ස්වාමීන්වහන්සේ යෝනාට උගන්වනසේක.

ඇ. මීකා 2:12–13; 4:1–7, 11–13; 5:2–4, 7–8; 6:6–8; 7:18–20. අන්තිම දවස්වලදී ඉශ්‍රායෙල්ගේ දූතමෙහෙය ගැන මීකා අනාවැකි කියයි.

- යෝනා නිනීවයට යාම ස්වාමීන්වහන්සේට අවශ්‍යවුනේ මන්ද? (බලන්න යෝනා 1:2.) ඒ වෙනුවට යෝනා තර්ෂිෂ්ට ගියේ මන්ද? (බලන්න යෝනා 1:3.) අපි සුභාරංචිය බෙදා නොගැනීමට තෝරාගන්නා යම් හේතුන් මොනවාද? ස්වාමීන්වහන්සේට කීකරුවී, සුභාරංචිය බෙදාගැනීමට වඩාත් වික්‍රමාන්විත වීමට යෝනාගේ කථාවෙන් අපට ඉගෙනගත හැක්කේ මොනවාද?
- පසු-දවස්වල දේවමාළිගාව ගැන මීකා අනාවැකියෙන් කීවේ මොනවාද? (බලන්න මීකා 4:1–2.)
- අපගෙන් අපේක්ෂාකරන සියල්ල මගින් යටපත්වූ හැඟීමක් අපට ඇතිවූ විට මීකා 6:–68 අපට උපකාරවත් වන්නේ කෙසේද?

## "මම නුඹව ධර්මිෂ්ඨකම ඇතිව මා වෙතට පාවාගන්නෙමි" 34

***හොෂෙයා 1–3; 11; 13–14***

පහත සඳහන් ශුද්ධ ලියවිලි අධ්‍යයනය කරන්නඃ

අ. හොෂෙයා 1–3. ඇදහිලිමත් ස්වාමිපුරුෂයෙක් සහ පරදාර කර්මයෙහි යෙදෙන බිරිඳකගේ උපමාවක් යොදාගෙන ස්වාමීන්වහන්සේ හා ඉශ්‍රායෙල් අතර සම්බන්ධතාවය හොෂෙයා විස්තරකරයි. මෙම පරිච්ඡේද තුලින් ස්වාමිපුරුෂයා ලෙස ස්වාමීන්වහන්සේත්, ඉශ්‍රායෙල් බිරිඳ ලෙස හොෂෙයාත් නියෝජනයවෙයි.

ආ. හොෂෙයා 11; 13–14. ස්වාමීන්වහන්සේ ජනතාවට දක්වන ප්‍රේමය නිසා, උන්වහන්සේ ඉශ්‍රායෙල්වරුන්ට පසුතැවී උන්වහන්සේ වෙතට ඒමට ආරාධනා කරනසේක.

- ස්වාමීන්වහන්සේ අපගෙන් අපේක්ෂාකරන කැපවීම සහ භක්තියේ ප්‍රමාණය ගැන හොෂෙයා 1–3 මගින් උගන්වන සංසංදනය කුමක්ද?
- ස්වාමීන්වහන්සේගෙන් ජනතාව හැරීයාමට හේතුවූ—ඉශ්‍රායෙල්ගේ "ප්‍රේමවන්ත" පුද්ගලයන් හෝ දේවල් මොනවාද? ගැලවුම්කරුවාණන් අනුගමනයකිරීමට අප තුල ඇති භක්තිය අපගෙන් බෙදා වෙන්කිරීමට සමත් දේවල් මොනවාද?
- සිය භාර්‍යාව ඔහු වෙතට හැරී එන්නේනම් ස්වාමිපුරුෂයා ඇයට පොරොන්දුවූයේ කුමක්ද? (බලන්න හොෂෙයා 2:19.) ජනතාව පසුතැවී උන්වහන්සේ වෙතට එන්නේ නම් ස්වාමීන් වහන්සේ ඔවුන්ට පොරොන්දුවන්නේ මොනවාද? (බලන්න හොෂෙයා 2:20, 23.)

අමතර කියවීම්ඃ හොෂෙයා ඉතිරි කොටස

# ස්වාමීන්වහන්සේ තමන් රහස් උන්වහන්සේගේ අනාගතවක්තෘවරුන්ට එළිදරව්කරනසේක

35

*ආමොස් 3; 7–9; යෝවෙල් 2–3*

පහත සඳහන් ශුද්ධ ලියවිලි අධ්‍යයනය කරන්නඃ

අ. ආමොස් 3:6–7. ස්වාමීන්වහන්සේ තමන් රහස් උන්වහන්සේගේ අනාගතවක්තෘවරුන්ට එළිදරව්කරන බව ආමොස් උගන්වයි.

ආ. ආමොස් 7:10–17; 8:11–13; 9:8–15. ස්වාමීන්වහන්සේ විසින් ආමොස්ව අනාගත වක්තෘවරයෙකු ලෙස කැඳවනු ලබයි (7:10–15). ඉශ්‍රායෙල්ගේ වහල්භාවය සහ විසිරයාම ගැන ඔහු අනාවැකි කියයි (7:16–17; 9:8–10). ස්වාමීන්වහන්සේගේ වචනය ඇසීමේ සාගතයක් ඇතිවන බවට ඔහු අනාවැකි කියයි (8:11–13). අන්තිම දවස්වලදී ඉශ්‍රායෙල් ශ්‍රේෂ්ඨ සහ සමෘද්ධිමත් ජනතාවක් වන බවට ඔහු අනාවැකි කියයි (9:11–15).

ඇ. යෝවෙල් 2; 3:16–17. අන්තිම දවස්වලදී යුද්ධ සහ විපත් ගැන යෝවෙල් අනාවැකි කියයි (2:1–11). ඔහු ජනතාව පසුතැවීමට කැඳවයි (2:12–14; සටහන, Joseph Smith Translation (ජෝසෆ් ස්මිත් පරිවර්තනයේ පද 13 සහ 14 පැහැදිළිකරන්නේ, පසුතැවුනේ ජනතාව මිස, දෙවියන්වහන්සේ, නොවන බවය). දෙවියන්වහන්සේ පසුදවස්වලදී ජනතාවට ආශිර්වාදකරමින්, උන්වහන්සේගේ ආත්මය ඔවුන් මත වගුරුවන බවට යෝවෙල් අනාවැකි කියයි (2:15–32; 3:16–17).

ආමොස් ඉශ්‍රායෙල් රාජධානියේ ජනතාවට ක්‍රිපූ 800 සිට 750ක කාලයක් සේවය කළේය. මෙම ජනතාවගෙන් බොහොමයක් ඇදහිල්ලෙන් වැටී සිටියහ. පාප සහිතව ජනතාව ඔහුට හමුවූවිට, දරුණු දඬුවම් ගැන ඔහු අනාවැකි කීවේය. එසේවුවද, පසුතැවෙන ඕනෑම අයෙක් පිරිසිදුකිරීමට දෙවියන්වහන්සේ කැමති බව ඔහු අවධාරණය කළේය. පසුදවස් ගැනද ආමොස් අනාවැකි කීවේය.

යෝවෙල් යුදා රාජධානියේ ජනතාවට සේවය කරයි. යෝවෙල්ගේ බොහෝ අනාවැකි පසුදවස් ගැනය.

- අනාගතවක්තෘවරුන්ගේ වැදගත්කම ගැන අනාගතවක්තෘ ආමොස් ඉගැන්වූ දේවල් මොනවාද? (බලන්න ආමොස් 3:7.) අනාගතවක්තෘවරුන්ගේ පණිවුඩකරුවන්ට අප තුල තිබිය යුතු ගරුත්වය ගැන දහම සහ ගිවිසුම 1:37–38 උගන්වන්නේ මොනවාද?
- ඉශ්‍රායෙල්වරුන් අනාගතවක්තෘවරුන්ගේ පණිවුඩ ප්‍රතික්ෂේපකිරීම හෝ නොසළකාහැරීමෙන් ඇති විය හැකි ප්‍රතිඵල මොනවාද? (බලන්න 8:11–13.) ස්වාමීන්වහන්සේගේ වචනය නැතිවීම සාගතයකට සමානවන්නේ කුමන මාර්ගවලින්ද? නැවත පිහිටුවූ සුභාරංචියේ ආශිර්වාද ලැබීම මංගල්‍යයකට සමානවන්නේ කෙසේද?
- යොවෙල් 2:12–32 සහ 3:16–17 සමාලෝචනයකර, පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සොයන්නඃ පසුදවස්වල ජීවත්වන අයට ස්වාමීන්වහන්සේ දී තිබෙන උපදෙස් මොනවාද? පසුදවස්වලදී උන්වහන්සේව අනුගමනයකරන අයට උන්වහන්සේ පොරොන්දුවී තිබෙන ආශිර්වාද මොනවාද?

අමතර කියවීම්ඃ ජෝසෆ් ස්මිත්—ඉතිහාසය 1:41; දහම සහ ගිවිසුම 1:14–28, 37–38.

## සයෝනයේ මහිමය ආරක්ෂාවක් වනු ඇත

## 36

*යෙසායා 1–6*

යෙසායා 1–6 අධ්‍යයනය කරන්න.

ගැලවුම්කරුවාණන්ගේ පොළොවේ දූත මෙහෙය ගැන, ඉශ්‍රායෙල්ගේ දුෂ්ටකම් නිසා ඇතිවන විනාශය ගැන, සහ පසුදවස්වල ඉශ්‍රායෙල්ගේ දූතමෙහෙය සහ දෛවය ගැන බොහෝ දේවල් යෙසායා අනාවැකියෙන් කීවේය.

- යෙසායාගේ බොහෝ අනතුරු ඇඟවීම් සහ අනාවැකි මහත් දුෂ්ටකම් තිබූ ඔහුගේ කාලය, සහ අපගේ කාලයටද අදාළය. යෙසායා 1–5 විස්තරකර තිබෙන තත්වයන්ට අද ලෝකයේ තිබෙන සාක්ෂි මොනවාද?
- යෙසායා 4:5–6 සඳහන්කර ඇති නපුරෙන් ආරක්ෂාව ලැබෙන ශුද්ධවූ ස්ථාන තුන මොනවාද? මෙම ශුද්ධවූ ස්ථාන අපව ආරක්ෂාකරන අන්දම ගැන විස්තර කිරීමට මෙම පදවල පාවිච්චිවන ප්‍රකාශ මොනවාද?

අමතර කියවීම්: 2 නිෆායි 11

## "නුඹ ශ්‍රේෂ්ඨ දේවල් කර ඇත"

## 37

***යෙසායා 22; 24–26; 28–30***

පහත සඳහන් ශුද්ධ ලියවිලි අධ්‍යයනය කරන්න:

අ. යෙසායා 22:22. ස්වර්ගික පියාණන් සමීපයට යාමට ගැලවුම්කරුවාණන් දොර විවෘත කරනසේක.

ආ. යෙසායා 24:21–22. ආත්ම සිරගෙයි සිටින අයට ගැලවුම්කරුවාණෝ දයාව පෙන්වති

ඇ. යෙසායා 25:1–4; 32:1–2. ගැලවුම්කරුවාණෝ ශක්තියක් සහ රැකවරණයක් වනසේක.

ඈ යෙසායා 25:6–9. ගැලවුම්කරුවාණෝ මංගල්‍යයක් සූදාම්කර "තිරය" විනාශකරන-සේක.

ශ. යෙසායා 25:8. ගැලවුම්කරුවාණෝ අපගේ කඳුළු පිසදමනසේක.

ඊ. යෙසායා 26:19. ගැලවුම්කරුවාණෝ නැවත නැගිටීම ලබාදෙනසේක.

උ. යෙසායා 28:16. ගැලවුම්කරුවාණෝ අපගේ ස්ථිර පදනමය.

ඌ. යෙසායා 29:4, 9–14, 18, 24. ගැලවුම්කරු-වාණෝ පොළොවේ සුභාරංචිය පිහිටුවන-සේක.

එ. යෙසායා 30:19–21. ගැලවුම්කරුවාණෝ අපගේ පරීක්ෂාවන් දැන අපට මාර්ගය පෙන්වන සේක.

- ගැලවුම්කරුවාණෝ " [අපගේ] කඳුළු පිසද-මන්නේ" කෙසේද? (යෙසායා 25:8).
- මෙසියස්වහන්සේ පැමිණෙන විට, උන්ව-හන්සේ මියගොස් නැවත නැගිටින බවට යෙසායා අනාවැකි කීවේය (යෙසායා 25:8). නැවත නැගිටුවන වෙනත් අය කවරහුද? (බලන්න යෙසායා 26:19; 1 කොරොන්ති 15:20–22; ඇල්මා 11:43–44.) අප නැවත නැගිටින විට අපට ඇතිවන හැඟීම් ගැන යෙසායා 26:19 යෝජනාකරන්නේ මොන-වාද? (තවද බලන්න ධ්‍යසහ්‍ය 138:12–16, 50.)

යෙසායාගේ අනාවැකි කිහිපයක් ඉටුවූ අන්දම ගැන දැනගැනීමට යෙසායා 29 පහත සඳහන් පද සමාන කොටස් සමග සසඳන්න:

| | |
|---|---|
| යෙසායා 29:4 | මොරෝනි 10:27 |
| යෙසායා 29:9–10, 13 | ජෝසෆ් ස්මිත්—ඉතිහාසය1:18–19 |
| යෙසායා 29:11–12 | ජෝසෆ් ස්මිත්—ඉතිහාසය1:63–65 |
| යෙසායා 29: 14 | දහම සහ ගිවිසුම 4:1; 6:1 |

- මුඛයෙන් ස්වාමීන්වහන්සේට ළංවී සිටින නමුත් ඔවුන්ගේ සිත් උන්වහන්සේගෙන් ඈත්ව තිබෙන බව යෙසායා කීවේය (යෙසායා 29:13). අපගේ සිතිවිලි වලින් සහ ක්‍රියාවෙන් මෙන්ම අපගේ වචනවලින්ද අප ස්වාමීන්වහන්සේට සමීපබව අප ස්ථිර-කරන්නේ කෙසේද?

## “මා ඇර වෙන ගැලවුම්කාරයෙක් නැත” 38

*යෙසායා 40–49*

යෙසායා 40–49 අධ්‍යයනය කරන්න.

- යෙසායා 40:28–31; 42:16; 43:1–4; 44:21–23; සහ 49:14–16 සමාලෝචනය කරන්න. ඔබ එක් එක් කොටස කියවන විට, පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සොයන්නඃ මෙම කොටසේ සඳහන්කර තිබෙන ගැලවුම්කරුවාණන්ගේ ගුණාංගය කුමක්ද? මෙම ගුණාංගය ගැන දැනගැනීම ගැලවුම්කරුවාණන් තුල ඇදහිල්ල වැඩිකිරීමට අපට උපකාරයක් වන්නේ කෙසේද?
- බබිලෝනිය ලෝකයේ දුෂ්ඨකම්වල සංකේතයක් ලෙස ශුද්ධ ලියවිලිවල නිතර කියවේ. ලෝකයේ මාර්ග පසුපස යාමේ ප්‍රතිඵල මොනවාද? (බලන්න යෙසායා 47:1, 5, 7–11.) ලෝකය පසුපස යෑම වෙනුවට, ස්වාමීන්වහන්සේ සොයන අයට උන්වහන්සේ පොරොන්දුවී තිබෙන්නේ මොනවාද? (බලන්න යෙසායා 48:17–18.)
- යෙසායා 49 බොහෝ අනාවැකි ස්වාමීන්වහන්සේගේ කටයුතු ගැන සහ උන්වහන්සේගේ සේවකයන්ගේ කටයුතු වලට අදාළවේ. පසුදවස්වල්දී අපගේ වගකීම් ගැන යෙසායා 49:1–6 උගන්වන්නේ මොනවාද?

## “කඳු පිට කෙතරම් අලංකාරද” 39

*යෙසායා 50–53*

යෙසායා 50–53 අධ්‍යයනය කරන්න

- ගැලවුම්කරුවාණන්ගේ ජීවිතය ගැන යෙසායා 53:2–5 අපට කියන්නේ මොනවාද? අපගේ දුක් වේදනා උන්වහන්සේට තේරුම්ගත හැක්කේ මන්ද? (බලන්න ඇල්මා 7:11–13; හෙබ්‍රෙව් 2:16–18; 4:15.) ඔබගේ දුක් වේදනා උන්වහන්සේට තේරෙන බව ඔබ දැනගත්තේ කෙසේද? ගැලවුම් කරුවාණෝ තුවාලවලින්, තැලීම්වලින් සහ කසපහරවලින් වේදනාවිඳීමට කැමතිවුනේ මන්ද? (බලන්න 1 නිෆායි 19:9.)
- ගැලවුම්කරුවාණන්ගේ වන්දිගෙවීමට සම්බන්ධ සිද්ධීන් ගණනාවක් ගැන යෙසායා අනාවැකි කීවේය. ගැලවුම්කරුවාණන්ගේ ප්‍රේමය සහ උන්වහන්සේගේ වන්දිගෙවීමේ පරිත්‍යාගය ගැන පහත සඳහන් පදවලින් උගන්වන්නේ මොනවාද?

යෙසායා 50:5–7 (තවද බලන්න මතෙව් 26:39; පිලිප්පි 2:8)

යෙසායා 51:6 (තවද බලන්න මොසායා16:9; ඇල්මා 34:10)

යෙසායා 53:2–4 (තවද බලන්න ඇල්මා 7:11–13; හෙබ්‍රෙව් 2:16–18)

යෙසායා 53:8–11 (තවද බලන්න මොසායා 15:10–13)

අමතර කියවීම්ඃ මොසායා 14–15.

## “නුඹේ කූඩාරම තිබෙන ස්ථානය විශාලකරපන්න” 40

*යෙසායා 54–56; 63–65*

යෙසායා 54–56; 63–65 අධ්‍යයනයකරන්න.

- සභාව කූඩාරමකටත්, සභාවේ ස්ටේකයන් කූඩාරමේ ස්ටේකවලටත් යෙසායා සමානකළේය (යෙසායා 54:2). සභාව සහ ස්ටේක සම්බන්ධව ඔහු දුන් උපදෙස් මොනවාද? (බලන්න යෙසායා 54:2–3.) අප ජීවත්වන ස්ටේකය ශක්තිමත්කිරීමට අපට කළ හැකි දේවල් මොනවාද?
- වර්ෂාව බීජ පෝෂණයකරන ලෙස දෙවියන්වහන්සේගේ වචනයට අපගේ ආත්ම පෝෂණයකිරීමට හැකි බව යෙසායා ලීවේය (යෙසායා 55:10–13). දේව වචනය අපගේ ආත්ම පෝෂණය කරන්නේ කෙසේද? (බලන්න ඇල්මා 32:28.)
- යෙසායා 65:17–25 වාර්තාකර තිබෙන ලෙස, සහස්‍ර කාලය තුල පවතින කොන්දේසි මොනවාද?

## “මම අද නුඹ. . . යකඩ කුළුනක් කළෙමි” 41

*යෙරමියා 1–2; 15; 20; 26; 36–38*

යෙරමියා 1–2; 15; 20; 36–38 අධ්‍යයනය කරන්න.

යෙරමියා ක්‍රිපූ 626 සිට 586 දක්වා රජවරුන් පස් දෙනෙකුගේ (යොෂියාගේ සිට සෙදකියාගේ) පාලන කාලයේදී සේවය කළේය. ජනතාව රූප වන්දනාවෙන් සහ දුරාචාරයෙන් වළක්වාගැනීමට යොෂියා සමග ඔහු උත්සාහ කළේය. යෙරමියාගේ ජීවිතය දුකින් පිරී තිබූ නමුත්. ඔහු පරීක්ෂාවන්ට දැක්වූ ප්‍රතිචාරවලට අප ප්‍රබෝධමත් කළ හැකිය. යුදා රාජධානියට විරුද්ධව අනාවැකි කීමෙන් ඔහුට පහරදී සිරගතකරන ලදී. ඔහුගේ ජීවිතයට නිරන්තර තර්ජන ඇතිවිය. කෙසේවුවද, සියලු විපත් සහ විරුද්ධතාවයන් තුලින්, ඔහු “යකඩ කුළුනක්” මෙන් විය (යෙරමියා 1:18). මෙම අනාගතවක්තෘවරයා සිය ජීවිතයේ දුක් සහ බලාපොරොත්තු කඩවීම්වලට දැක්වූ ප්‍රතිචාර ගැන යෙරමියාගේ පොත පුද්ගලික ඇදහිල්ල වර්ධනය වන වාර්තාවක් සපයයි.

- පූර්ව නියමයේ දහම ගැන යෙරමියාගේ කැඳවීම අපට කියාදෙන්නේ කුමක්ද? (බලන්න යෙරමියා 1:5.)
- ස්වාමීන්වහන්සේ යෙරමියාට දුන් දූතමෙහෙය ඉටුකිරීමේදී ඔහුට මුහුණදීමට සිදුවූ විරෝධතා මොනවාද? (බලන්න යෙරමියා 20:1–6; 26:7–15; 36:1–6, 20–24, 27–32; 37:12–16; 38:4–13.)
- අපට විපත් අත්විඳීමට සිදුවන විට උපකාරවත්වීමට යෙරමියාගෙන් අපට ඉගෙනගැනීමට හැක්කේ මොනවාද?
- යෙරමියාගේ ඇතුලාන්තයේ ස්වාමීන්වහන්සේගේ වචනය තිබෙන බව යෙරමියා 20:9 තුලින් ඔහු විස්තර කළේ කෙසේද? ස්වාමීන්වහන්සේගේ වචනය ඔබගේ කටු තුල ඇවිලෙන ගින්නක් ලෙස තිබීම ගැන ඔබ සිතන්නේ කුමක්ද?

## “ මම ඒක ඔවුන්ගේ සිත්වල ලියන්නෙමි” 42

*යෙරමියා 16; 23; 29; 31*

*යෙරමියා* 16; 23; 29; 31 අධ්‍යයනය කරන්න.

- යෙරමියා 31:31–34 වාර්තාකර තිබෙන පරිදි, පසුදවස්වලදී කිරීමට ස්වාමීන්වහන්සේ පොරොන්දු වුනේ මොනවාද? (බලන්න එසකියෙල් 11:17–20; 36:24–28; 2 කොරොන්ති 3:2–3.) දෙවියන්වහන්සේගේ නීතිය අපගේ සිත්වල ලියාගැනීම යන්නෙහි අදහස කුමක්ද? දෙවියන් වහන්සේගේ නීතිය අපගේ සිත්වල ලියාගැනීමට අප කුමක් කළ යුතුද? දෙවියන් වහන්සේගේ නීතිය අපගේ සිත්වල ලියාතිබෙන විට අපගේ හැසිරීමට එය බලපාන්නේ කෙසේද?
- යෙරමියා 29:12–14 අනුව, දෙවියන්වහන්සේට සමීපවීමට අපට කළ හැකි දේවල් මොන-වාද?

අමතර කියවීම්: යෙරමියා 3–9; 13; 30; 32:37–42; 33; 35.

## ඉශ්‍රායෙල්වරුන්ගේ එඬේරු 43

*එසකියෙල් 18; 34; 37*

පහත සඳහන් ශුද්ධ ලියවිලි අධ්‍යයනය කරන්න;

අ. එසකියෙල් 34. තම රැළවල් පෝෂණය නොකරන එඬේරුන්ට ස්වාමීන්වහන්සේ තරවටු කරනසේක. උන්වහන්සේ නැතිවුන සියලු බැටළුවන් සොයා උන්ගේ එඬේරා-ණන් වනසේක.

ආ. එසකියෙල් 18:21–32. පසුතැවෙන දුෂ්ටයන් ගලවාගන්නා අතර, දුෂ්ටකම් කරන ධර්මිෂ්-ඨයන් පිටතට එළවාදමන බව එසකියෙල් උගන්වයි.

ඇ. එසකියෙල් 37:1–14. වියළි ඇට බොහොම-යකට ජීවය දෙන දර්ශනයක් එසකියෙල් දකියි.

ඈ. එසකියෙල් 37:15–28. යුදාගේ ලීය සහ යොසෙප්ගේ ලීය ස්වාමීන්වහන්සේගේ හස්තයේ එකක් වන බවට එසකියෙල් අනාවැකි කියයි.

ක්‍රිපූ 597දී බබිලෝනියේ නෙබුකද්නෙශර් රජු යුදා රාජධානියෙන් බොහෝ දෙනෙක් වහලුන් ලෙස ගෙනගියේය. මෙම වහලුන් අතර එසකි-යෙල්ද සිටි අතර, වසර පහකට පසුව ස්වා-මීන්වහන්සේ ඔහුව අනාගතවක්තෘවරයෙකු ලෙස කැඳවූසේක. එසකියෙල් පිටුවහල් කළ ඔහුගේ ජනතාවට ක්‍රිපූ 570 දක්වා සේවය කළේය. එසකියෙල්ගේ ලියවිලිවල ඇතුලත් දොස්කීම් සහ පොරොන්දු පැරණි යුදා රාජධානියේ ජනතාවට පමණක් නොව, වර්තමාන සහා සාමාජියන්ටද අදාළවේ. යෙරුසලම විනාශවී තිබුනද, ඉශ්‍රායෙල් එකතුවී නැවත පිහිටුවන බව ඔහුට දර්ශනය විය.

- එසකියෙල් 34 තුලින් කථාකරන “ඉශ්‍රායෙල් එඬේරුන්” කවරහුද? අප හැම කෙනෙක්ම ඉශ්‍රායෙල් එඬේරෙක් ලෙස සැලකිය හැක්කේ කුමන අන්දමින්ද?
- ගැලවුම්කරුවාණන් අපට එඬේරාණන් වන්නේ කෙසේද? (බලන්න එසකියෙල් 34:11–16; ගීතිකා 23.)
- “අළුත් සිතක් සහ අළුත් ආත්මයක්. . . සාදාගනිල්ලා” යන්නෙහි අදහස කුමක්ද? (එසකියෙල් 18:31). මෙම සිතේ වෙනස්වීම අපට අත්විඳිය හැක්කේ කෙසේද? (බලන්න ඇල්මා 5:7–14.)
- එසකියෙල් 37:15–28 සඳහන් අනාවැකිය තුල, යුදාගේ ලීය නියෝජනයකරන එක් දෙයක් නම් බයිබලයවේ. යොසෙප්ගේ ලීය නියෝජනයකරන එක් දෙයක් නම්, මෝර්මන්ගේ පොතයි. බයිබලයට අමතරව මෝර්මන්ගේ පොත තිබීමෙන් ලැබී තිබෙන ආශිර්වාද මොනවාද?

අමතර කියවීම්: එසකියෙල් 2

## “ගංගාව ගලන කොතැනක නුමුත් ඉන්න සියල්ලන් ජීවත්ව සිටිනවා ඇත” 44

*එසකියෙල් 43–44; 47*

පහත සඳහන් ශුද්ධ ලියවිලි කියවන්නː

අ. එසකියෙල් 43:1–12; 44:6–9, 23. එසකියෙල්ට දර්ශනයකින් යෙරුසලමේ දේවමාළිගාව පෙන්වනු ලබයි.

ආ. එසකියෙල් 47:1, 6–12. දේවමාළිගාවෙන් ගංගාවක් ගලාවිත් කාන්තාරයට ජීවය ලබාදී, මළ මුහුද සුවපත්කිරීම එසකියෙල් දකියි.

ඇ. එසකියෙල් 47:2–5 එසකියෙල් වතුරේ ගැඹුර මනින අතර, ඔහු වතුරට බසින හැම අවස්ථාවකදීම වතුර ගැඹුරුවන බව ඔහු සොයාගනියි.

- එසකියෙල් 43:1–12 සහ 44:6–9, 23 තුලින් දේවමාළිගාව ගැන ඔබට කුමක් ඉගෙනගත හැක්කේ කුමක්ද?

- එසකියෙල්ගේ දර්ශනය අනුව, ගංගාව දේවමාළිගාවෙන් ගලායන නිසා, යෙරුසලමට නැගෙනහිරින් පිහිටා තිබෙන යුදා වනාන්තරය සහ මළ මුහුද තුල ඇතිවන වෙනස්කම් මොනවාද? (බලන්න එසකියෙල් 47:6–12.) දේවමාළිගාවේ තිබෙන ජීවනදායක ජලයෙන් විවාහවලට? පවුල්වලට? අපගේ මුතුන් මිත්තන්ට? සභාවට? ජීවනය ලබාදෙන්නේ කෙසේද?

ඔබ එසකියෙල් 47:1, 6–12 විස්තරය අධ්‍යයනයකරන විට, එළිදරව් 22:1–3 සහ 1 නීෆායි 8:10–11; 11:25 අධ්‍යයනයකිරීමට ඔබට අවශ්‍යවිය හැකිය. මෙම කොටස්වල ඇති සමාන ප්‍රතිරූප බලන්න.

## “මා නැතිවුණොත්, නැතිවුණාවේ” 45

*දානියෙල් 1; 3; 6; එස්තර් 3–5; 7–8*

පහත සඳහන් ශුද්ධ ලියවිලි අධ්‍යයනය කරන්නː

අ. දානියෙල් 1. දානියෙල් සහ ඔහුගේ මිතුරෝ නෙබුකද්නෙශර් රජුගේ අහාර ප්‍රතික්ෂේප කරති (1:1–16). දානියෙල් සහ ඔහුගේ මිතුරන්ට හොඳ ශරීර සෞඛ්‍යයක් සහ ඥානය සමගින් ස්වාමීන් වහන්සේ ආශිර්වාද කරනසේක (1:17–21).

ආ. දානියෙල් 3. ෂද්‍රක්, මේෂක්, සහ අබේද්-නෙගෝ නෙබුකද්නෙශර්ගේ රූපය වන්දනාකිරීම ප්‍රතික්ෂේප කරති (3:1–12). නෙබුකද්නෙශර් රජතුමා ඔවුන්ව ගිනි උදුනට දමන අතර, ස්වාමීන් වහන්සේ ඔවුන්ව මරණයෙන් ගලවාගන්නාසේක (3:13–30).

ඇ. දානියෙල් 6. දවස් 30ක් යන තුරු සියලුම අයදුම් යම් මනුෂ්‍යයෙකුට හෝ දෙවි කෙනෙකුට නොව, රජුට ඉදිරිපත්කල යුතු බවට ආඥාවක් අත්සන් කිරීමට දාරියස් රජුගේ මිනිස්සු රජු පොළඹවති (6:1–9). රජුගේ ආඥාව නොතකා, දානියෙල් දෙවියන්වහන්සේට යාච්ඤාකරයි (6:10–13). ආඥාවට අකීකරුවීමට දඬුවමක් ලෙස, දානියෙල්ව සිංහ ගුහාවට දමයි (6:14–17). දානියෙල් ආරක්ෂාකිරීමට ස්වාමීන්වහන්සේ දේවදූතයෙක් යවනසේක (6:18–23).

ඈ. එස්තර් 3–5; 7–8. එස්තර්ගේ ඥාති සොයුරෙක් වන මොර්දෙකායි, හාමාන්ට නමස්කාර කිරීම ප්‍රත්ක්ෂේප කරයි (3:1–4). රාජධානියේ සියලුම යුදෙව්වන් මරාදමන බවට ආඥාවක් නිකුත්කිරීමට හාමාන් අහස්වේරාෂ් රජු පොළඹවයි (3:5–14). තම ජනතාව මරාදැමීමේ හාමාන්ගේ සැලසුම දැනගත් එස්තර්, අහස්වේරාෂ් රජුගේ උපකාර පතා යාම මගින් තම ජීවිතය පරදුවට තබයි (4:1–17). හාමාන් සමග

රජුට මංගල්‍යයකට එන ලෙස එස්තර් කල ඉල්ලීමට රජතුමා අවසරදෙයි (5:1–8). යුදාවරුන් මැරීමට හාමාන් කළ කුමන්ත්‍රණය මංගල්‍යයේදී එස්තර් හෙළිකරයි (7:1–6). රජු හාමාන්ව එල්ලා දමයි (7:7–10). රජු මෝර්දෙකායිට ගරුකර, එස්තරගේ ඉල්ලීම ලබාදී හාමාන්ගේ ආඥාව අපසු හරවයි (8:1–17).

තරුණ ළමයෙක්ව සිටියදී, දානියෙල්ව යෙරුසලමේ සිට වහලෙකු ලෙස බබිලෝනියට රැගෙන යන ලදී. ඔහු සහ ඔහුගේ අනෙක් හේබ්‍රෙව් තරුණයන්වූ—ෂද්‍රක්, මේෂක්, සහ අබේද්-නෙගෝ ඇතුළු ඔහුගේ මිතුරන්ව—නෙබුකද්නෙෂර් රජ මාලිගාවේදී පුහුණු කරන ලදී.

එස්තර් වනාහි දානියෙල්ගේ කාලයට පසුව ජීවත්වූ යුදා කාන්තාවකි. ඇයගේ දෙමාපියන්ගේ මරණයෙන් පසුව. ඇයව හදා වඩා ගත්තේ ඇයගේ ඥාති සොයුරෙක් වන මෝර්දෙකායි විසිනි. එස්තර් ඉතා ලක්ෂණවූ අතර, පර්සියාවේ සහ මීදියාවේ අහස්වේරාෂ් රජු, ඇයගේ රූපශ්‍රීයෙන් සතුටුව ඔහුගේ රැජින කරගත්තේය.

- දානියෙල්ට සහ ඔහුගේ මිතුරන්ට රජතුමාගේ භෝජනය සහ මුද්‍රික පානය දෙන විට ඔවුන් යෝජනා කළේ කුමක්ද? (බලන්න දානියෙල් 1:8–14.) අප ප්‍රඥාවේ වචනයට කීකරුවුවහොත්, ස්වාමීන්වහන්සේ අපට පොරොන්දුවන ආශිර්වාදවලට ඔවුන් ලැබූ ආශිර්වාද සමානවන්නේ කෙසේද? (බලන්න දානියෙල් 1:15, 17, 20; ධ්‍යසහසී 89:18–20.)
- ෂද්‍රක්, මේෂක්, සහ අබේද්-නෙගෝ උදුනට දැමූ විට සිදුවුනේ කුමක්ද? (බලන්න දානියෙල් 3:21–27.) ඔවුන් සමග උදුනේ සිටි අනෙක් තැනැත්තා කවුද? (බලන්න දානියෙල් 3:25.) අපගේ පරීක්ෂාවලදී අප ස්වාමීන්වහන්සේ වෙත හැරෙන විට උන්වහන්සේ අපට උපකාරකරන්නේ කෙසේද?
- එස්තර්ට වැනි ධෛර්‍යයක් අවශ්‍යවන අද අප මුහුණදෙන අභියෝග මොනවාද? අප අසීරු විපාකවලට මුහුණදුන් විට පවා, අප හරි දේ කිරීමට පරිශ්‍රමදරන විට අපට ලැබෙන ආශිර්වාද මොනවාද?

අමතර ඉගැන්වීම්ඃ එස්තර් 1–2; 6; 9–10.

---

## "කිසි කලක නැති නොවන, රාජ්‍යයක්" 46

*දානියෙල් 2*

පහත සඳහන් ශුද්ධ ලියවිලි අධ්‍යයනය කරන්නඃ

අ. දානියෙල් 2:1–23. නෙබුකද්නෙෂර් රජු සිහිනයක් දැක එය විසඳා විස්තරකරදීමට ඔහුගේ උපදේශකයන්ට නියෝග කරයි (2:1–13). දානියෙල් ඔහුගේ මිතුරන් සමග යාච්ඤාකරන අතර, දෙවියන්වහන්සේ සිහිනය සහ එහි අර්ථය එළිදරව්කරනසේක (2:14–23).

ආ. දානියෙල් 2:24–49. නෙබුකද්නෙශර්ගේ සිහිනයෙන් කියවෙන්නේ පොළොවේ ශ්‍රේෂ්ඨ රාජ්‍යයන්වල නැගීම සහ වැටීම සහ පසුදවස්වලදී සියලු රාජ්‍යයන් අභිබවා දෙවියන්වහන්සේගේ රාජ්‍යය ජයග්‍රහනයකිරීම යයි, දානියෙන් සිහිනය එළිකරයි.

- රජතුමා සිහිනයක් තුලින් දුටු මහත් රූපය දානියෙල් විස්තර කළේ කෙසේද? (බලන්න දානියෙල් 2:31–33.) රූපයේ විවිධ කොටස් නියෝජනය කරන්නේ මොනවාද? (බලන්න දානියෙල් 2:36–43.)
- "අතින් නොකැපූ. . . ගල" නියෝජනය වන්නේ කුමක්ද? (බලන්න දානියෙල් 2:44–45; ධ්‍යසහසී 65:2.) පසුදවස්වලදී පිහිටුවන සභාව සම්බන්ධව දානියෙල් අනාවැකි කීවේ කුමක්ද? (බලන්න දානියෙල් 2:34–35, 44.) සභාව "මුළු පොළොව පුරවන්නේය" එමෙන්ම "කිසිකලෙක නැති නොවන්නේය" යන දානියෙල්ගේ අනාවැකිය අද ඉටුවෙමින් තිබෙන්නේ කෙසේද?

අමතර කියවීම්ඃ දහම සහ ගිවිසුම 65.

# “අපි නැගිට ගොඩනගමු” 47

***එස්රා 1–8; නෙහෙමියා 1–2; 4; 6; 8***

පහත සඳහන් ශුද්ධ ලියවිලි යාච්ඤාවෙන් අධ්‍යයනය කරන්නඃ

අ. එස්රා1–6. කෝරෙෂ් රජු බබිලෝනියේ වහලුන්ව සිටි යුදා ජාතිකයන් නිදහස්කර යෙරුසලමට ගොස් දේවමාළිගාව නැවත ගොඩගැනීමට ඔවුන්ට ආරාධනාකරයි (එස්රා 1). සෙරුබ්බාබෙල්ද යේෂූවාද 50,000ක පමණ ජනතාවක් යෙරුසලමට නැවත ගෙන යති, ඔවුහු දේවමාළිගාව නැවත ගොඩනැගීම ආරම්භකරති (එස්රා 2–3). දේවමාළිගාවේ වැඩවලට උදව්වීමට සාමාරියන් කැමැත්ත පළකළද, එය ප්‍රතික්ෂේප වෙයි. ඔවුහු වැඩ නැවැත්වීමට උත්සාහ කරති, නැවත ගොඩනැගීම් නවතියි (එස්රා 4). වසර කිහිපයකට පසුව, හග්ගයි සහ සෙකරියා අනාගතවක්තෘවරු දේවමාළිගාව නිමකිරීමට යුදාවරුන් දිරිමත් කරති; සමාරියාවරු එයට බාධාකරති (එස්රා 5; තවද බලන්න හග්ගයි 1). දේවමාළිගාව නැවත ගොඩනැගීමට කෝරෙෂ් දුන් ආඥාව දාරියස් රජු අළුත් කරයි, එය නිමවී, ක්‍රිපූ 515දී පමණ කැපකරන ලදී (එස්රා 6).

ආ. එස්රා 7–8. තවත් යුදාවරුන් කණ්ඩායමක් නැවත යෙරුසලමට ගෙනයාමට පාර්සියාවේ අරතක්ෂස්තා රජුගෙන් එස්රාට අවසර ලැබෙයි. එස්රා සහ ඔහුගේ ජනතාව උපවාසකර යාච්ඤා කරන අතර, ස්වාමීන්වහන්සේ ඔවුන්ව ආරක්ෂාකරනසේක.

ඇ. නෙහෙමියා 1–2; 4; 6. යෙරුසලමට නැවත ගිය යුදාවරුන්ට “බලවත් විපත් සහ දෝෂාරෝපන” ඇති බව දැනගත් නෙහෙමියාට නුවර පවුරු ගොඩනැගීම සඳහා යෙරුසලමට යාමට අරතක්ෂස්තා රජුගෙන් අවසර ලැබෙයි (නෙහෙමියා 1–2). යුදාගේ සතුරෝ පවුරු ගොඩනැගීමෙන් ඔවුන් වළක්වාලීමට කටයුතු කරති. පවුරු නිමකරන තුරු වැඩ කරගෙන යාමට නෙහෙමියා කටයුතු කරයි (නෙහෙමියා 4; 6).

ඈ. නෙහෙමියා 8. යෙරුසලම වටා පවුරු නැවත ගොඩනැගීමෙන් පසුව, එස්රා ජනතාවට ශුද්ධ ලියවිලි කියවීය. ජනතාව හඬමින් ව්‍යවස්ථාවේ වචනවලට කීකරුවීමට කැමතිවෙති.

ක්‍රිපූ 562 දී නෙබුකද්නෙශර් මියගිය පසුව බබිලෝනිය සීග්‍රයෙන් බලයෙන් පිරිහී ගියේය. ක්‍රිපූ 539 දී, බබිලෝනිය මෙදියවරුන් සහ පාර්සියන්වරුන්ට යටත්වූ අතර, ඔවුහු කෝරෙෂ්ගේ නායකත්වය යටතේ එකමුතුව සිටියහ (බලන්න දානියෙල් 5). නෙබුකද්නෙශර් මෙන් නොව, කාරුණික නායකයෙක්වූ කෝරෙෂ්, ජයග්‍රාහී ජනතාවට කාරුණිකව සලකමින් ඔවුන්ගේ ආගම්වලට ගරු කළේය.

බබිලෝනිය බාරගැනීමෙන් පසුව ඉක්මණින්ම වාගේ, කෝරෙෂ් ඔහුගේ අධිරාජ්‍යයේ යුදාවරුන්ට (ඉශ්‍රායෙල්වරුන්ට) යෙරුසලමට නැවත ගොස් දේවමාළිගාව නැවත ගොඩනැගීමට ආරාධනා කළේය.

ක්‍රිපූ 458 දී, යුදා පූජකවරයෙක්, සහ ලියන්නෙක්වූ, එස්රා, තවත් යුදා කණ්ඩායමක් බබිලෝනියෙන් යෙරුසලමට නැවතත් ගෙන ආවේය. බබිලෝනියේ රජ මාළිගයේ පාත්‍ර දැරීමේ (පාත්‍රධාරී) වැදගත් කාර්‍යයක් කළ යුදාවරයෙක් වූ, නෙහෙමියා, යෙරුසලමේ පවුරු ගොඩනැගීම සඳහා රාජකීය අවසරය ලබාගත්තේය. නෙහෙමියා සහ එස්රා එක්ව වැඩකරමින් මෙම කාර්‍යයය ඉටුකරගැනීමට යුදාවරුන්ට උපකාර කළහ.

- වැඩ නවතා තමා හමුවන ලෙස සන්බලාට් නෙහෙමියාට කී විට ඔහු කළේ කුමක්ද? (බලන්න නෙහෙමියා 6:1–4.) ස්වාමීන්වහන්සේගේ වැඩකරන සහා සාමාජිකයන්ගේ සිත එයින් හැරවීමට අද සමහරු උත්සාහ කරන්නේ කෙසේද? එවැනි සිත් හැරවීම්වලට අප ප්‍රතිචාර දැක්විය යුත්තේ කෙසේද?
- එස්රා කොපමණ කාලයක් ජනතාවට ශුද්ධ ලියවිලි කියවූවේද? (බලන්න නෙහෙමියා 8:3, 17–18.) ජනතාව ප්‍රතිචාර දැක්වූයේ කෙසේද? (බලන්න නෙහෙමියා 8:3, 6, 9, 12.) අප ශුද්ධලියවිලි කියවන විට දැඩි අවධානයකින් සිටිය යුත්තේ කෙසේද? මෙම ජනතාවට ශුද්ධ ලියවිලිවලට තිබූ ආශාව වැනි ආශාවක් අප දියුණුකර ගන්නේ කෙසේද?

අමතර කියවීම්ඃ හග්ගායි 1; ——

## “ස්වාමීන්වහන්සේගේ මහත්වූ භයානක දවස” 48

***සෙකරියා 10–14; මලාකි***

සෙකරියා 10–14 සහ මලාකි අධ්‍යයනය කරන්න.

- සෙකරියා සහ මලාකි අන්තිම දවස්වල ඇතිවන බොහෝ සිදුවීම් අනාවැකියෙන් කියති. පහත සඳහන් කොටස්වල විස්තරවන සිදුවීම් මොනවාද?

  සෙකරියා 12:2–3, 8–9

  සෙකරියා 14:3–4 (තවද බලන්න ධ්‍යීසහසී 45:48)

  සෙකරියා 12:10; 13:6 (තවද බලන්න ධ්‍යීසහසී 45:51–53)

  සෙකරියා 14:5 (තවද බලන්න ධ්‍යීසහසී 88:96–98)

  සෙකරියා 14:9

  සෙකරියා 14:12–13; මලාකි 4:1–3 (තවද බලන්න 1 නිෆායි 22:15–17, 19)

  මලාකි 3:1

  මලාකි 4:5–6 (තවද බලන්න ධ්‍යීසහසී 2; 110:13–16)

- ජනතාව දසයෙන් කොටස සහ පිදුම් නොගෙවන විට, ඔවුන් “දෙවියන්වහන්සේගෙන් කොල්ලකන” බව මලාකි කීවේය (මලාකි 3:8–9). මෙය සත්‍යයක් වන්නේ කෙසේද?

- “පියවරුන්ගේ සිත් දරුවන් වෙතටත්, දරුවන්ගේ සිත් පියවරුන් වෙතටත් හැරවීම” යන්නෙහි අදහස කුමක්ද? (එහි අදහස නම්, අපගේ සියලුම මුතුන්මිත්තන්—අපගේ “පියවරුන්”— සහ අපගේ සියලු පරම්පරා—අපගේ “දරුවන්”—ජීවත්වන්නන් සහ මියගිය අය වෙනුවෙන් පූජකවරයේ මුද්‍රාකිරීමේ බලයෙන් සහ දේවමාළිගා නියෝග තුලින් සියලු සදාකාලය දක්වා මුද්‍රාකිරීමය.)

- ඔබ ඔබගේ මුතුන් මිත්තන් වෙනුවෙන් පවුලේ ඉතිහාසය සහ දේවමාළිගා කටයුතු කර තිබෙන විට, ඔබගේ හදවත ඔවුන්වෙත හැරෙන බව ඔබට හැඟුනේ කෙසේද? දේවමාළිගා ගිවිසුම් වල පොරොන්දු ඔබගේ දෙමාපියන්, ඔබගේ භාර්‍යාව සහ පුරුෂයා, සහ දරුවන් වෙත ඔබගේ හදවත හරවන්නේ කෙසේද?

අමතර කියවීම්: දහම සහ ගිවිසුම 45.

**යේසුස් ක්‍රිස්තුස්**
**වහන්සේගේ**
පසුදවස්වල ශුද්ධවන්තයන්ගෙන් යුත්
සභාව

ඉදිරිපස කවර ය; *හන්නා සිය දරුවාවූ සාමුවෙල් ඒලිට ඉදිරිපත්කිරීම,* රොබට් ටී. බැරට් විසිනි

ප්‍රකාශනය යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පසු-දවස්වල ශුද්ධවන්තයන්ගෙන් යුත් සභාව විසිනි
සෝල්ට් ලේක් සිටි, යූටා

© 1996, 2010 Intellectual Reserve, Inc. විසිනි. සියලු හිමිකම් ඇවිරිණි.
ඇමෙරිකා එක්සත් ජනපදයේ මුද්‍රණයකරන ලදී.

ඉංග්‍රීසි අනුමැතිය; 1/01.
පරිවර්තන අනුමැතිය: 1/01.

Old Testament: Class Member Study Guide පරිවර්තනයයි.

SINHALA
4 02345 92408 7
34592 408